මිල රු.80

උපුල් ජෝසප් ප්‍රනාන්දුගේ
ගුරුදු විග්‍රහය



SLPP-SLFP-UNP ඉවරයි
2024 සටන SJB සහ JVP


2022.08.21 ඉරිදා | හතරවැනි කාණ්ඩය | 11 වැනි කලාපය
දැන් ඉරිදා

# මව්රට



P ≫ 12

මෙන්න තෙල් සංස්ථාවේ මහ දවල් ගහන ගැහිලි



P ≫ 10

අරාබියේ පැරීසිය වූ ලෙබනනයට වෙච්ච දේ ලංකාවටත් වෙයිද

# ඇමෙරිකාව ගෝඨාභයට නඩු දමයි

P ≫ 02

## සීතා එළියට ගෝඨා පාර්ලිමේන්තුවට

P ≫ 02



# පොහොට්ටුවට ඇමැතිකම් 17ක්

P ≫ 02

## මාසයකින් අලුත් ආණ්ඩුවක්

# අලුත් ආණ්ඩුවේ අගමැති ගෝඨා

## චන්ද්‍රිකාගේ මහින්දගේ රනිල්ගේ
## ඇමැතිකම් ගත්ත ඇමැති පෙරේතයෝ කවුද?

P ≫ 02

## සජබ ඇමැතිකම් ගන්නේ නෑ ආණ්ඩුවට යන්නෙත් නෑ



සජිත් කියයි

ඩොලර්වලට, රුපියල්වලට, වරප්‍රසාදවලට යටවී සමගි ජන බලවේගයේ කිසිදු මන්ත්‍රීවරයකු වත්මන් ආණ්ඩුවේ ඇමැති ධූර නොගන්නා බව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පැවසීය. සජබ මන්ත්‍රීවරුන් ආණ්ඩුවට එක්වන බවට මේ වනවිට සැලසුම්ගත දැවැන්ත මාධ්‍ය ප්‍රචාරයක් දියත් කර ඇති බවත්, එම ප්‍රචාරයන් සම්පූර්ණයෙන්ම අසත්‍යයක් බවත් විපක්නායකවරයා පෙන්වා දුන්නේය.

P ≫ 02

## #GOTACOMEHOME
## ගෝඨා ගෙදර එන්න ව්‍යාපාරය අරඹයි

මේ වන විට තායිලන්තයේ බැංකොක් නුවර රැඳී සිටින හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට යළි ලංකාවට පැමිණෙන ලෙස බලකරමින් දැවැන්ත සමාජ මාධ්‍ය මෙහෙයුමක් ආරම්භ කිරීමට සැලසුම් වී තිබේ. #GotaComeHome යනුවෙන් මෙම මාධ්‍ය මෙහෙයුම දියත්ව ඇති බව වාර්තා වේ.

## භයානකයි මම අනතුරු අඟවනවා

ෆීල්ඩ් මාෂල්



අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය මගින් ඊයේ දින පැවැත්වූ විරෝධතාව මර්දනය කිරීම සඳහා දහස් ගණනක් විශේෂ කාර්ය බළකා සෙබළුන් යොදා ගැනීම සම්බන්ධයෙන් ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා සිය විරෝධය ප්‍රකාශ කොට ඇත. ඒ පිළිබඳව ෆොන්සේකා මහතා තැබූ ෆේස්බුක් සටහන මෙසේය.

P ≫ 02

## අස්කරගත් නඩු 45 ආයෙත් දාලා

ප්‍රේමලාල් විජේරත්න

විවිධ අල්ලස් හෝ දූෂණ චෝදනා එල්ලවී නඩු පවරා තිබී නැවත පැවරීමට යටත්ව ඉල්ලා ඇස්කරගෙන තිබූ අල්ලස් නඩු 45ක් යළිත් අඩුපාඩු සකස් කර අධිකරණවලට ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇතැයි අල්ලස් හෝ දූෂණ කොමිසමේ මාධ්‍ය ලේකම් අප්සරා කල්දේරා මහත්මිය 'මව්රට'ට පැවැසුවාය. මීට පෙර එම නඩු පිළිබඳ චෝදනා තිබූ කාර්ය පටිපාටියේ දෝෂයක් නිසා...

P ≫ 02

## ලොක්කෝ නිදි බෙහෙත් හිඟය එකයි

රජයේ රෝහල්වලට ඖෂධ හිඟය දැඩිව බලපා ඇත්තේ ඒ පිළිබඳ බිම් මට්ටමේ සත්‍ය තත්ත්වය ගැන සෞඛ්‍ය අමාත්‍යාංශයේ බලධාරීන් නිසි පරිදි සොයා නොබැලීම නිසා බව රජයේ වෛද්‍යවරුන්ගේ සංගමයේ මාධ්‍ය ලේකම් වෛද්‍ය චමිල් විජේසිංහ මහතා 'මව්රට'ට පැවැසීය.

P ≫ 02

## කෝටි 6000ක කාබනික පාඩුව ඇමැතිලාගෙන් ගන්න

ප්‍රේමලාල් විජේරත්න

කාබනික පොහොර සංකල්පය නිසා රටට පාඩුවුණු රුපියල් කෝටි 6,000ක මුදල එය වගකිව යුතු මැති ඇමැතිවරුන්ගෙන් අයකරගත යුතු බව සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න මහතා 'මව්රට' පැවැසීය. මෙතරම් මුදල් පාඩුවී ඇති බව පසුගියදා වගකිව යුතු ඇමැතිවරයකු සිනාසෙමින් පවසා ඇති බව...

P ≫ 02



# පිටි ටින් එකේ හොරකම

## තාත්තා කෙනෙකුගේ දෝරේ ගලාගිය දරු සෙනෙහස

**ජීවිතය කියන්නේ මහ පුදුමාකාර දෙයක්. අපට දැන් අහන්නට දකින්නට ලැබෙන්නේ අනුවේදනීය පුවත්. මේ කතාවත් සමාජයේ එක් පැතිකඩක එක් දුක් ගැනවිල්ලක් විතරයි. මෙවැනි කතා අපේ රටේ නිවෙස් තුළ අනන්තවත් ඇති. මේ නිසා දැවෙන්නේ මේ රටේ මිනිස්සුන්ගේ අහිංසක හදවත්. දරුවන්ගේ ලෝකය තනා දෙන්න වෙහෙසෙන තාත්තලා මේ ලෝකේ අනන්තවත් ඉන්නවා. තාත්තෙක් තම දරුවන්ට හැම මොහොතේම ආදරය දෙන්නේ සඟවලා. දරුවෙක් ඉපදෙනකොට අම්මා කෙනකුට තාත්තා කෙනකුට දැනෙන සතුට පල දරන්නට නම් ඔවුන් තම දරුවන් වෙනුවෙන් නිසියාකාරව යුතුකම් ඉෂ්ට සිද්ධ කළ යුතුයි. නමුත් එලෙස යුතුකම් ඉෂ්ට කරන්නට අපොහොසත් වුණාම මවුපියන් පත්වන්නේ දැඩි අසරණභාවයකටයි.**

මවුපියවරුන්ගේ හද කම්පාකරවන අනුවේදනීය සිදුවීමක් පසුගිය දවසක වාර්තා වුණේ අලුත්ගම ප්‍රදේශයෙන්. තම සිඟිති දරුවා කුසගින්න දරාගන්න බැරිව හඬාවැටෙන විට ඒ තාත්තාට එය බලා සිටින්නට බැරි වුණා. ඒ වෙලාවට හොඳ නරක නෙවෙයි තාත්තාට දැනෙන්නේ, දරුවාගේ බඩගින්න නිවන්නේ කොහොමද කියන එකයි. දරුවාට කිරි ටිකක් හොයාගන්නේ කොහොමද කියමින් ඔහු දහස් වරක් සිතන්නට ඇති. කිරිපිටිවල මිල ගණන් අහස උසට ගිහින්. කිරිපිටි ගන්න මුදලුත් නැහැ. නමුත් කරන්නට කිසිවක් නැහැ. මේ තාත්තා නිවෙසින් පිටවුණේ කෙසේ හෝ දරුවාට කිරි පිටි පැකට්ටුවක් රැගෙන එන බව තමන්ටම කියාගනිමින්.

පසුගිය 16 වැනිදා ප්‍රදේශයේ පිහිටි සුපිරි වෙළෙඳසලක් වෙත ගිය මේ තාත්තා එහි තිබූ රුපියල් 3,100ක් පමණ වටිනා කිරිපිටි ටින් එකක් සොරාගෙන තමන් ඇඳ සිටි කමිසය තුළ එය සඟවා ගත්තේ ගෙදර අඬන දරුවාගේ කුසගින්න නිවාලන්නට වෙනත් කළ හැකි දෙයක් නොමැති තැනයි. කෙසේ වෙතත් වෙළෙඳසලේ සේවිකාවක් එය දැක ආරක්ෂක අංශ දැනුවත් කිරීමෙන් පසු ඔහු අත්අඩංගුවට ගැනීමට පොලිසිය කටයුතු කර තිබුණා. මෙලෙස අත්අඩංගුවට ගැනුණේ 30 හැවිරිදි ධීවරයෙක්. තමන් සිදුකළ වරද පිළිබඳ ඔහු හඬා වැටෙමින් පොලිසිය ඉදිරියේ පාපොච්චාරණය කර තිබුණේ මේ ආකාරයටයි.

'මගේ දරුවාට අවුරුද්දයි මාස අටයි. දරුවා අඬනවා බලා ඉන්න බැරිකමට පිටි ටින් එක සොරාගත්තා...'

මේ අඬන පුංචි නොදරුවා දන්නේ නැහැ අම්මාට තාත්තාට කිරි ගෙනත් දෙන්න වත්කමක් නැහැ කියන වග. මෙවැනි දරුවන්ගේ අඳෝනාව මේ රටේ බලධාරීන්ට දැනෙන්නේවත් ඇහෙන්නේවත් නැහැ. ඔවුන් දන්නේ නීතිය ක්‍රියාත්මක කරන්න විතරයි. ඒ කිරි දරුවාගේ දුක දැනුණේ අම්මාට තාත්තාට විතරද කියලයි සමාජයෙන් අහන්න තියෙන්නේ? අද මහ මඟ පාර අයින්වල ඉස්කෝලේ යන්න බැරිව කුණු බාල්දි අවුස්සමින් කොයිතරම් අසරණ දරුවන් ඉන්නවාද? මේ තත්ත්වය හරිම ඛේදනීයයි. මෙලෙස වීදිවල ඉන්න දරුවන් අකුරක් ඉගෙනගන්නේ නැතුව අනාගතයේ සල්ලාලයන් මංකොල්ලකරුවන් බවට පත්වෙනවා. කවුද මේ දේට වග කියන්න ඕනේ? රටේ පවතින අධි උද්ධමනය නිසා මිනිසුන් හෙම්බත් වෙලා ඉන්නේ. දරාගැනීමේ ශක්තිය හීන වෙලා. තාත්තෙක් කවදාවත් දරුවකුට කියන්නේ නෑ මට උඹට කන්න දෙන්න බැහැ, උඹව පෝෂණය කරන්න බැහැ කියලා. මේ වචන කවදාවත් තාත්තකුගෙන් අහන්න ලැබෙන්නේ නැහැ.

තාත්තාගේ ආදරය කියන්නේ මේ ලෝකේ ඇති සුන්දරතම හැඟීමක්. මෙයට දුප්පත් පොහොසත්කම බලපාන්නේ නැහැ. පියෙකුගේ ආදරය දරුවන්ට සීමාවක් නැහැ. තමන් නොකා නොබී හරි දරුවන්ගේ කුස පුරවන්නයි ඔහුට ඕනේ වුණේ. මේ පියාත් දරුවාගේ බඩගින්න ගැන දහස් වරක් කල්පනා කරන්නට ඇති. දහස් වරක් හිතින් අඬන්නට ඇති. කරකියා ගන්නට දෙයක් නැතිවෙන්න ඇති.


අම්මා කෙනෙකු පෝෂණයෙන් ඉහළ නම් කවදාකවත් තම දරුවාට දෙන්නට තම ළයේ කිරි නොමැති වන්නේ නැහැ. දරුවාට දෙන්නට තරම් කිරි එරෙන්නේ නැත්තේ ඇයට නිසි පෝෂණීය ආහාර වේලක් නොලැබෙන නිසයි.

මවුකිරි කියන්නේ දරුවකුගේ අයිතියක්. නමුත් කිරි දෙන්න තරම් පෝෂණයක් අම්මාට නැත්නම් ඇය පත්වෙන්නේ දැඩි අසරණභාවයකටයි. අම්මා කෙනකුගේ හිතේ සතුටක් තිබුණහොත් පමණයි පෝෂණයක් පවතින්නේ. සමාජයේ අඩු ආදායම්ලාභී පවුල්වල බිලිඳු දරුවන්ටවත් රජයෙන් සහනයක් නැත්නම් ඔවුන් අසරණ වීම පුදුමයට කරුණක් නොවෙයි.

අම්මා කෙනකු තාත්තා කෙනකු දරුවකු බිහිකරන්න කරන කැපකිරීම දන්නේ කිරිකැටියන් සිටින මවුපියන් විතරද? ඇයි අපේ රටේ බලධාරීන්ට මේවා පේන්නේ නැත්තේ? මේ අම්මාට තාත්තාට තම දරුවා කුසගින්නේ අඬනකොට බත් කටක්වත් කන්න නොසිතෙන්නට ඇති.

හැම අම්මෙක් තාත්තෙක්ම තම දිවි දෙවැනි කොට දරුවන්ට රැකවරණය පෝෂණය සලසා දෙනවා. ඒ අම්මලා තාත්තලාගේ හැටි. දරුවෙක් තුළ කරුණාව සහ ප්‍රඥාව යන දෙකම එක ලෙස පැවැතිය යුතුයි. ඒත් ඇතැම් දරුවන් තම මවුපියන්ව අනාගතයේ වැඩිහිටි නිවාසවලට යොමු කරනවා. සමහර දරුවන් මවුපියන්ට සලකන්නේ ඉඩකඩම් ලියාගන්නා තුරු පමණයි. මවුපියන් තමන්ව පෝෂණය කළේ කොහොමද කියලා එක දශමයක්වත් ඒ දරුවන්ට හිතෙන්නේ නැහැ.

මෙලෙස දහදුක් විඳලා දරුවො හැදුවත් මවුපියන්ට නොසලකන දරුවන් ඕනෑ තරම් අද සමාජයේ දැකගන්න ලැබෙනවා. මේ විදියට දුක් විඳලා හැදුව දරුවෝ මවුපියන්ගේ දුක් වේදනා තේරුම් ගත්තා නම් අද සමාජයේ වැඩිහිටි නිවාස ඇතිවෙන එකක් නැහැ. අම්මෙක් තාත්තෙක් තම දරුවන්ව ආරක්ෂා කරන්නේ තමන්ගේ පණ වගේ. එවැනි මවුවරුන්ට පියවරුන්ට බුදුවරයකුට වගේ සැලකීම සෑම දරුවකුගෙම යුතුකමක්. එලෙස මවුපිය උපස්ථානය උපරිම අයුරින් සිදුකරන බොහෝ දරුවන් අපේ සමාජයේ අනන්තවත් සිටිනවා. ඔවුන් ඒ සිදුකරන උපස්ථානය මහා පින්කමක්. මවුපිය උපස්ථානය යනු මේ ලෝකයේ ඉහළම සැප ලැබිය හැකි පුණ්‍යකර්මයක් බව බුදුරජාණන්වහන්සේ පවා දේශනා කළේ ඒ නිසාමයි.



**පසුගිය 16 වැනිදා ප්‍රදේශයේ පිහිටි සුපිරි වෙළෙඳසලක් වෙත ගිය මේ තාත්තා එහි තිබූ රුපියල් 3,100ක් පමණ වටිනා කිරිපිටි ටින් එකක් සොරාගෙන තමන් ඇඳ සිටි කමිසය තුළ එය සඟවා ගත්තේ ගෙදර අඬන දරුවාගේ කුසගින්න නිවාලන්නට වෙනත් කළ හැකි දෙයක් නොමැති තැනයි.**



**මවුකිරි කියන්නේ දරුවකුගේ අයිතියක්. නමුත් කිරි දෙන්න තරම් පෝෂණයක් අම්මාට නැත්නම් ඇය පත්වෙන්නේ දැඩි අසරණභාවයකටයි. අම්මා කෙනකුගේ හිතේ සතුටක් තිබුණහොත් පමණයි පෝෂණයක් පවතින්නේ. සමාජයේ අඩු ආදායම්ලාභී පවුල්වල බිලිඳු දරුවන්ටවත් රජයෙන් සහනයක් නැත්නම් ඔවුන් අසරණ වීම පුදුමයට කරුණක් නොවෙයි.**



**'මගේ දරුවාට අවුරුද්දයි මාස අටයි. දරුවා අඬනවා බලා ඉන්න බැරිකමට පිටි ටින් එක සොරාගත්තා...'**



නිලන්ති රේණුකා

PAGE - 01

## SDB බැංකුව 25වැනි සංවත්සරය අභිමානයෙන් සමරයි

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් ඇතුළු සමස්ත ශ්‍රී ලාංකේය ජන ප්‍රජාවගේ දියුණුව වෙනුවෙන් සුවිශේෂ මෙහෙයක් ඉටුකරන SDB බැංකුව සිය සේවය වසර 25ක් පුරා අඛණ්ඩව ලබාදෙමින් ඓතිහාසික සංධිස්ථානයකට පැමිණ ඇත.

SDB බැංකුව සිය 25 වැනි සංවත්සරය පාදක කරගනිමින් පවත්වන නිල මාධ්‍ය හමුව 2022 අගෝස්තු මස 17 වැනි දින කොළඹ, කිංස්බරි හෝටලයේ Balmoral ශාලාවේදී පැවැත්විණි.

මෙහිදී මූලික අදහස් දැක්වීම සිදුකළ SDB බැංකුවේ සභාපතිනි දිනිති රත්නායක මිය සහ වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී නිරංජන් තංගරාජා මහතා වසර 25ක් පුරා බැංකුව පැමිණි ඓතිහාසික ගමන් මඟ පිළිබඳවත් බැංකුවේ අනාගත දැක්ම සහ ඉදිරි බලාපොරොත්තු පිළිබඳවත් ප්‍රකාශ කළහ.



## ඇමෙරිකාව ගෝඨාභයට...

හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව එරට අධිකරණය හමුවේ නඩු පැවරීමට ඇමෙරිකානු රජය පියවර ගෙන තිබේ.

හිටපු ජනාධිපතිවරයා 2019 වසරේදී සිය ඇමෙරිකානු පුරවැසිභාවය ඉවත් කිරීමට ප්‍රථම සිදුවූ සිදුවීම් කිහිපයක් මුල් කරගෙන මෙම නඩුපැවරීම සිදුකොට ඇති බව දැනගන්නට තිබේ. මෙහි වැඩිදුර තොරතුරු 'රාජ්‍ය රහස්' තීරයේ පළවේ.

## සීතා එළියට...

හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නැවත වතාවක් දේශපාලනයට ගෙනැවිත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පත්කිරීමේ මෙහෙයුමක් පොහොට්ටුව පාර්ශ්වයෙන් මේ වන විට දියත් වී තිබේ.

ඒ අනුව මේ වන විට පොහොට්ටුවේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරියක වන සීතා අරඹේපොල මහත්මිය සිය ධුරයෙන් ඉවත්වී ගෝඨාභය රාජපක්ෂ මහතාට එම අවස්ථාව ලබාදීමට නියමිතය. එසේ පාර්ලිමේන්තු පැමිණීමෙන් පසු පොහොට්ටු මන්ත්‍රීවරුන් බහුතරයකගේ අස්සන් ලබාගෙන ගෝඨාභය රාජපක්ෂ මහතා අගමැතිවරයා වශයෙන් පත්කිරීමේ සැලසුමක්ද මේ වන විට පොහොට්ටු පාර්ශ්වයෙන් දියත්වී තිබේ.

## භයානකයි...

නිරායුධ සාමකාමී විශ්වවිද්‍යාල සිසුන්ගේ විරෝධතා පෙළපාළියකට පහරදී පලවා හැරීමට සන්නද්ධ පොලිස් හා විශේෂ කාර්ය බළකා සෙබළුන් දහස්ගණනක් මේ ආකාරයෙන් යෙදවීම රටක ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක නොවන බවට කදිම නිදසුනකි.

මැයි 9 වෙනිදා මහින්ද රාජපක්ෂ අගමැතිවරයා මේ ආකාරයටම මැර පිරිසක් යොදවා සාමකාමීව අවිහිංසාවාදීව පවත්වාගෙන ආ අරගලයට පහර දුන්නේය. අද රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා ඒ වෙනුවට රජයේ සන්නද්ධ පොලිස් හා හමුදා කණ්ඩායම් යොදවාගනිමින් සිටියි.

මැයි 9 වෙනිදා ප්‍රහාරයෙන් ඉක්බිති සිදුවූ දේ රටම දුටුවේය. මේ පාර කපමින් සිටින්නේ ඊටත් එහාගිය බරපතළ ජනතා නැගිටීමකට අවශ්‍ය ඉඩකඩ නිර්මාණය කරමින් බව අදක්ෂ අකාර්යක්ෂම ජනතාද්‍රෝහී පාලකයින් තේරුම් ගත යුතුය.

පොලීසිය හා හමුදාව යොදවා ජනතාව අතරින් නැගී එන විරෝධතා මෙලෙස සන්නද්ධව මර්දනයට ලක් කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ලෝකය කිසිදිනෙක අනුමත නොකරනු ඇත.

ජාත්‍යන්තර සහාය අත්‍යාවශ්‍ය මෙවන් මොහොතක මෙවැනි අනවශ්‍ය මර්දනකාරී ප්‍රතික්‍රියාවන්ගේ බලපෑම සමස්ත රටවැසියා තවදුරටත් පීඩාවට පත් කරනවා නොඅනුමානය.

## චන්ද්‍රිකාගේ මහින්දගේ...

පාර්ලිමේන්තුවේ සිටින එක්තරා කොට්ඨාසයක් ඇමැතිකම් ගැනීමට පුදුම ආශාවකින් සිටින බව සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂණ රාජකරුණා මහතා කියා සිටියේය. මාධ්‍ය හමුවකට එක්වෙමින් ඒ මහතා පෙන්වා දුන්නේ මොවුන්ට විපක්ෂයේ සිට පුරුදු නැති බවත්, පැවැති ආණ්ඩු 6කම මෙම පිරිස් එක දිගට ඇමැතිකම් දරා ඇති බවත්ය. ඔවුන් නිතරම ජාති ආලය ගැන කතා කළ ද ඇත්තේ ජාති ආලය නොව ඇමැති ආලය බවද ඒ මහතා කියා සිටියේය.

## පොහොට්ටුවට ඇමැතිකම්...

ඉදිරි මාසය ඇතුළත නව ආණ්ඩුවක් පිහිටුවීමට නියමිත බවත්, එම ආණ්ඩුවේ කැබිනට් අමාත්‍ය ධුර 17ක් පොහොට්ටුවට හිමිවීමට නියමිත බවත් වාර්තා වේ.

සර්වපාක්ෂික ආණ්ඩුවක් ලෙස නොව, ජාතික ආණ්ඩුවක් ලෙස මෙම නව ආණ්ඩුව පිහිටුවීමට නියමිත බවද දැනගන්නට ඇත. පසුගිය බ්‍රහස්පතින්දා (18) ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සහ පොහොට්ටුවේ ජාතික සංවිධායක බැසිල් රාජපක්ෂ මහතා අතර සිදුවූ සාකච්ඡාවේදී මෙම එකඟතාවට පැමිණ තිබේ.

## කෝටි 6000ක...

සඳහන් කළ ඒ මහතා, ගොවි ජනතාව වෙනුවෙන් වැය කළ යුතුව තිබූ එම විශාල මුදල විනාශ කළ පුද්ගලයන්ට දඬුවම් ලබාදී, ඔවුන්ගේ දේපොළවලින් එය අයකරගත යුතු බවද පැවැසීය.කන්න තුනක් පාළු වූ ගොවීන් සඳහා මෙතෙක් කිසිදු වන්දි මුදලක් ලබාදී නැති බවද නාමල් කරුණාරත්න මහතා පැවැසීය.

## අස්කරගත් නඩු 45...

යළි පැවරීමට යටත් කොට ඉල්ලා අස්කරගෙන තිබූ බවත්, ඒවා යළි නිවැරැදි කොට නඩු පැවරීමට පියවර ගත් බවද ඇය සඳහන් කළාය.

මේ අතර එවැනි අන්දමට ඉල්ලා අස්කරගෙන තිබූ අල්ලස් නඩු සංඛ්‍යාව 45ක් බවද සඳහන්ය.

මෙම නඩු අතරින් දැනට යළි පවරා ඇති අල්ලස් නඩුවලට අතිරේකව ඉතිරිව ඇති ඉල්ලා අස්කරගත් නඩු යළි පැවරීම පිළිබඳ අධ්‍යයනය කරගෙන යන බවයි ඇය සඳහන් කළේ.

## සජබෙ ඇමැතිකම්...

ජනතාව බලාපොරොත්තු වන්නේ එවැනි තැන්තැන්වලින් ඇහිඳගත් පාලනයක් නොව, ජනතා ප්‍රශ්නවලට විසඳුම් දෙන සියලු දෙනාටම පිළිගත හැකි වැඩපිළිවෙළක් බවද ඒ මහතා අවධාරණය කර සිටියේය.

මේ සූදානම් වන්නේ ජනතා අභිලාෂයන්ට එරෙහිව ගොස් සල්ලිවලට මන්ත්‍රීවරුන් බිලි බා ගැනීමේ පරණ පුරුදු සෙල්ලමම සිදු කිරීමට බවත්, ඊට සජබය කිසිදු අයුරකින් දායක නොවන බවත්, විපක්ෂ නායකවරයා පෙන්වා දුන්නේය.

## ලොක්කෝ නිදි...

ඒ පිළිබඳ තම සංගමය මගින් තාක්ෂණ කමිටුවක් පත්කර දැනට බෙහෙත් හිඟයක් බලපා ඇති සියලු රෝහල් ගැන සමීක්ෂණයක් පවත්වාගෙන යන බවත්, එහි වාර්තාව මෙම සති අන්තයේ තම සංගමයට ලැබීමට නියමිතව ඇති බවත් ඔහු සඳහන් කළේය.

විදෙස් රටවලින් බෙහෙත් ද්‍රව්‍ය ගෙන්වා ගැනීමට ඩොලර් ප්‍රශ්නයට වඩා බලපා ඇතතේ නිසි කළමනාකරණයක් නොමැතිකම සහ සම්බන්ධීකරණ වැඩපිළිවෙළෙහි පවතින දුර්වලකම් බවයි ඔහු සඳහන් කළේ.



# වගා හානියට වන්දි විදියට තනතුර අහිමි වුණ දඬුලේනා

**මේ ලිපිය කියවන්න ගන්නකොට ඔබ මගෙන් අහයි යකෝ මේ රටේ ප්‍රශ්නවල හැටියට ඕවත් ප්‍රශ්නද කියලා. නෑ, ඇත්තටම මේක ප්‍රශ්නයක්. මොකක්ද දන්නවද ප්‍රශ්නෙ? රටක ජාතික සත්වයා, ජාතික පුෂ්පය, ජාතික ක්‍රීඩා මේවා නම්කරන්නේ ස්ථාවරව. හිතුණු හිතුණු වෙලාවට වෙනස් කරන්න නෙවෙයි. එහෙම වෙනස් කළා කියලා ඒක රටට බලපාන්නෙ කොහොමද, මිනිසුන්ගෙ ජීවිතවලට බලපාන්නෙ කොහොමද කියලා කෙනෙක් ඇහුවොත් ඇත්තටම ඒකට දෙන්න උත්තරේකුත් නෑ.**

එහෙම මිනිසුන්ගෙ ජීවිතවලට විශාල බලපෑමක් මේකෙන් එල්ල වෙනවා කියලා කියන්න බෑ තමයි. ඒත් මේ රට ඇයි ජාතික සත්වයාව වෙනස් කරන්නේ? එහෙම වෙනස් කරන එක ලොකු ප්‍රශ්නයක්. අපි අපේ ජාතික ක්‍රීඩාවත් වෙනස් කරපු රටක් නේ. මෙහෙම එක එක දේවල් වෙනස් කරමින් ගිහිල්ලා අන්තිමට කොහොම හරි ලංකාවෙ නමත් වෙනස් කරගත්තොත් මේ ණය කන්දරාවෙන් බේරෙන්න අපට පුළුවන් වෙන්න ඉඩ තියෙනවා. මොකද හේතුව එහෙම රටක් ලෝකෙ නෑ කියලා අපට කියන්න පුළුවන් නේ. ශ්‍රී ලංකාව තමයි අපෙන් ණය ගත්තේ කියලා කිව්වාම, අපේ නම වෙන මොකක් හරි වුණා නම් අපට කියන්න පුළුවන් ලෝකෙට අපේ රටේ කවුරුත් ණය අරගෙන නෑ. අපේ රට අලුත් රටක්. මේක බ්‍රෑන්ඩ් නිව් වර්ෂන් එකක්. ඒ පරණ වර්ෂන් එක. ඒක දන් නෑ. ඉතින් කරන්න දෙයක් නෑනෙ. ඒ හින්දා ඒවා ගොන් පාට්. හැබැයි මේ කතන්දරේ ඇතුළේ වෙනම අර්ථයක් තියෙනවා. මොකක්ද මේ දඬුලේනා ජාතික සත්වයාගෙන් ඉවත් කරන්න හේතුව? ගොවියො ඉල්ලීමක් කරනවා. මිනිස්සු ඉල්ලීමක් කරනවා. මේ සතා අපේ වගා බිම් හානිකරනවා, පුදුම කරදරයක් කරන්නේ මේකා කියලා. ඒ නිසා අපිට මූ මරන්න බෑ. හානි කරන්න බෑ සතාට. හේතුව තමයි මූ ජාතික සත්වයා වීම. දඬුලේනා නිදහස් කරගන්න සහ උෟ රැකගන්න තියෙන එකම විකල්පයත් මේක ඉවත් නොකර සිටීම. අහිසංක සත්තු කී දාහක් මේකෙන් පස්සේ මැරිලා යයිද කියලා අපට අවංකව සහ වගාබිම්වල වේදනාව නොදන කියන්න පුළුවන්. ඒත් වගාවන් විනාශ කිරීම ගැන ඒ මිනිසුන්ගෙන් ඇහුවොත් ඒ මිනිස්සු තරම් මේකෙන් පීඩා විඳින කෙනෙක් මේ ලෝකෙ නෑ. ඇත්තටම දඬුලේනා කියලා කියන්නේ දැඩි ලෙස වගාවන්ට හානි කරන සතෙක්. වගාවන්ට විතරක් නෙවෙයි, කොස් ගහට, අඹ ගහට, දෙල් ගහට, මේ විදියට බවබෝග හැදෙන ගස් කොළන් සියල්ලටම දඬුලේනා හානි කරනවා. පොල් ගහේ ඇට්ටි කාලෙදි පොල් ගෙඩිය කඩලා බිම දානවා. නොයෙක් පලතුරු ගස්වලටත් එහෙමයි. මේ විදියට දඬුලේනාගෙන් හානි සිදුවෙනකොට මිනිසුන්ට වතුපිටි දාලා අතහැරලා යන්න හිතෙන තරමට මේ ප්‍රශ්නෙ දරුණු වෙනවා. හැබැයි දඬුලේනා විතරක් නෙවෙයි. මේ විදියටම වගාවට හානි කරන තවත් සත්තු ඉන්නවා. මිනිසුන්ගෙ ජන ජීවිතය අඩාළ කරන සත්තු ඉන්නවා. ඒ කවුද කියලා ඇහුවොත් ඔබ පුදුම වෙයි සමහර විට. එක්කෙනෙක් තමයි වඳුරා. දඬුලේනා තරම්ම වඳුරාගෙනුත් කරදරයි. දඬුලේනාටත් වඩා වඳුරාගෙන් කරදර වෙන්නේ රංචු පිටින් ඇවිල්ලා ගේ දොරවල තියෙන දේවල් පවා හොරකම් කරගෙන යන තැනට පත්වෙන හින්දා.

ඒ වගේ තවත් සතෙක් තමයි අලියා. හැබැයි ඊටත් වැඩිය වගාවන්ට හානි කරන සත්තු දෙදෙනෙක් විදියට මොනරා සහ ගිරවා හඳුන්වා දෙන්න පුළුවන්. හැබැයි මේ සත්තුත් විවිධ කාරණා නිසා මරාදැමීමට පහර දීමට නොහැකි තැනට පත්වෙලා තියෙනවා. සාමාන්‍යයෙන් වඳුරා ලංකාවෙ නැතත් ඉන්දියාවෙ අතිශය වන්දනාවට පාත්‍රවෙන සතෙක්. ලංකාවෙත් ඇතැම් ප්‍රදේශවල වඳුරාට යම් ගරුත්වයක්, දේවත්වයෙන් ඇදහීමක් තියෙනවා. ඒ වගේම මොනරා කියලා කියන්නේ කතරගම දෙවියන්ගේ වාහනය. මොනරු බහුලව ඉන්නේ මොනරාගල, කතරගම වගේ ප්‍රදේශවල. ඒ ප්‍රදේශවල මිනිස්සු කිසිසේත්ම වගාවන්ට මොන හානි කළත් මොනරා ප්‍රසිද්ධියේ මරාදැමීමට කැමැති වෙන්නේ නෑ. ඒ නිසා මොනරාගෙන් සිදුවෙන හානියට කරන්න දෙයක් නැති තැනට ඒ මිනිස්සු පත්වෙලා ඉවරයි.

> **ගිරවා කියන සතාට නම් යම් විදියකට හානි කරන්න මිනිස්සුන්ට ප්‍රශ්නයක් නැති වුණත් ගිරවා කියන්නේ ඉතා අහිංසක පුංචි සතෙක්. ඒ වගේම අලියා මරා දැමීම මනුෂ්‍ය ඝාතනයක් හා සමාන වරදක් නිසා අලි මරන්න මිනිස්සු බයයි. ඉතින් මේ ඔක්කොමත් එක්ක ගත්තම අපි සත්තුන්ගෙ පැත්තෙන් කතා කළාට මිනිස්සුන්ගෙ පැත්තෙන් කතා කළාම ඇත්තටම මිනිස්සු පව්.**

ගිරවා කියන සතාට නම් යම් විදියකට හානි කරන්න මිනිස්සුන්ට ප්‍රශ්නයක් නැති වුණත් ගිරවා කියන්නේ ඉතා අහිංසක පුංචි සතෙක්. ඒ වගේම අලියා මරා දැමීම මනුෂ්‍ය ඝාතනයක් හා සමාන වරදක් නිසා අලි මරන්න මිනිස්සු බයයි. ඉතින් මේ ඔක්කොමත් එක්ක ගත්තම අපි සත්තුන්ගෙ පැත්තෙන් කතා කළාට මිනිස්සුන්ගෙ පැත්තෙන් කතා කළාම ඇත්තටම මිනිස්සු පව්. මිනිස්සු හරි අසරණයි. මිනිස්සු වගාවන් කරන්නේ, බවබෝග අස්වනුවලින් තමන්ගෙ ජීවිත සාර්ථක කරගන්න. කන්න බොන්න, අඳින්න පලඳින්න. ජීවිතේ හදාගන්න. එහෙම අවස්ථාවක් වෙනුවෙන් හීන දකින මිනිසුන්ගෙ ජීවිත උඩු යටිකුරු කරලා දානවා නම් ඒක හරි භයානක තත්ත්වයක්. ඉතින් ඒ භයානක දේ දඬුලේනා කරනවා නම් දඬුලේනාට විරුද්ධව පියවරක් ගන්න එකත් සාධාරණයි. අන්තිමට මෙහෙම එකක් තියෙනවනේ. දඬුලේනාගෙන් පස්සේ කවුද අපි ජාතික සත්වයා බවට පත්කර ගන්නේ? ලංකාවෙ මිනිස්සු හිතන පතන විදියයි, ලංකාවෙ මිනිස්සු තීරණ ගන්න විදියයි, ලංකාවෙ මිනිස්සු විශේෂයෙන්ම දේශපාලනය කරන විදියයි මේ මොහොතේ පවා ලංකාවේ දේශපාලකයො කතාකරන කියන දේවල් එක්ක ගත්තට පස්සේ අපට තියෙනවා යෝජනාවක්. මේ රටට වඩාත්ම ගැළපෙන ජාතික සත්වයා මොකාද කියන එක ගැන. ඒ ජාතික සත්වයා මොකාද කියන එක ගැන ඔබටත් විවිධ යෝජනා ඇති. අපි මේ ලිපිය සමාජ ජාලවල පළ කළාට පස්සේ අපේ 'මව්රට' වෙබ් අඩවියේ පළවුණාට පස්සේ අපි අපේ තියෙන සමහර ලිපි ට්විටර් ඔස්සේ ඔබට එවනකොට ඔබට පුළුවන් මේකට කමෙන්ට් එකක් දාන්න. ඔබට පුළුවන් යෝජනා කරන්න අපේ රටේ මිනිස්සුන්ගෙ ඇවතුම් පැවතුම්, චාරිත්‍ර වාරිත්‍ර, සාමාන්‍ය ජීවිතේ ගතකරන ආකාරය සහ විශේෂයෙන්ම බුද්ධි මට්ටම ගැන සැලකිලිමත් වෙලා අපිට ගැළපෙන සතා මොකාද කියලා අපි යෝජනාවක් කරනවා. තරහා වෙන්න එපා. මේ දේවල් දකිනකොට මේ දේවල් ඇහෙනකොට අපට හිතෙනවා දඬුලේනා ජාතික සත්වයාගෙන් අයින් කරලා, අපි බූරුවා ලංකාවෙ ජාතික සත්වයා කළා නම් වැඩියෙන්ම ගැළපෙයි කියලා.



**ජීවන පහන් තිළිණ**

# රුපියල් 20ට අවුරුදු 22ක් නඩු කියපු චතුර්වේදී

**පසුගිය 05 වැනිදා ඉන්දියානු උසාවියෙන් අපට අසන්නට ලැබුණේ ඉන්දියානු ජාතිකයකු අසාධාරණයට විරුද්ධව මීට වසර 22කට පෙර ගොනුකළ නඩුවකින් ජයගැනීම ගැන කියැවෙන පුවතකි. එම ජයග්‍රහණය සඳහා ඔහු නොපසුබට වීර්යයෙන් කටයුතු කර තිබීම විශේෂත්වයක්. මේ බව ඉන්දියානු මාධ්‍ය කිහිපයක්ම වාර්තා කර තිබුණා. මේ සිදුවීම සිදුව තිබුණේ උතුරු ඉන්දියාවේ උත්තර ප්‍රදේශ් ප්‍රාන්තයේ මතුරා කැන්ටුන්මන්ට් දුම්රිය ස්ථානයේ. එම නඩුව ගොනුකර තිබුණේ 1999 වර්ෂයේ දෙසැම්බර් 25වැනිදා.**

නීතිඥ තුංගනාත් චතුර්වේදි අදාළ දුම්රිය ස්ථානයට පැමිණියේ තමන් උපන් ගම වූ උත්තර ප්‍රදේශයේ මතුරා නගරයේ සිට මොරාදාබාද් දක්වා ගමන් කිරීමට සිතාගෙනයි. එම ප්‍රවේශපත් දෙක සඳහා නියමිත මිලට වඩා රුපියල් 20ක් වැඩියෙන් අයකරගන්නට ප්‍රවේශපත් කවුළුවේ නිලධාරියා කටයුතු කර තිබුණා. ටිකට් පතක නියමිත මිල වී තිබුණේ ඉන්දියානු රුපියල් 35කි. ටිකට් පත් දෙකට රුපියල් 70 වෙනුවට ඔහු අයකර තිබුණේ රුපියල් 90ක මුදලක්. තුංගනාත් චතුර්වේදි රුපියල් 100ක් දුන් විට ඉතිරි මුදල් ලෙස ඔහුට ලබාදී තිබුණේ රුපියල් 10කි. ඔහු තමාගෙන් වැඩිපුර මුදලක් අයකර ඇතැයි නිලධාරියාට පවසා සිටියත් ඔහුට ඉතිරි මුදල් ලබාදෙන්නට කටයුතු කර නැහැ. මෙම සිදුවීමෙන් සිත්තැවුලට පත් ඔහු ඉන්දීය දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඊසානදිග දුම්රිය දෙපාර්තමේන්තුවට සහ ප්‍රවේශපත් කවුළුවේ නිලධාරියාට විරුද්ධව මතුරාහි පාරිභෝගික අධිකරණයේ නඩුවක් ගොනු කිරීමට තීරණය කළා. ඔහු මේ නඩුව සඳහා අවස්ථා ගණනාවකදී නඩු වාර රාශියකට පෙනී සිටියා. අවසානයේ වසර 22කට පසුව ඔහුට එම නඩුවෙන් ජය ගන්නට හැකිවුණා.

මේ පිළිබඳ චතුර්වේදි ඉන්දීය මාධ්‍ය වෙත අදහස් පළකර තිබුණේ මෙලෙසින්.

'මම මේ නඩුව සඳහා නඩු වාර 100කට වැඩි ප්‍රමාණයකට සහභාගි වුණා. විටෙක දුම්රිය දෙපාර්තමේන්තුවෙන් මගේ නඩුව නිෂ්ප්‍රභ කරන්නටත් හැදුවා. ඒ, දුම්රිය ප්‍රශ්නවලට විරුද්ධව පැමිණිලි කළ යුත්තේ දුම්රිය විනිශ්චය සභාවක මිසක් පාරිභෝගික උසාවියක නොවන බව පවසමින්. ඒත් අපි 2021 ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් භාවිත කරලා පාරිභෝගික අධිකරණයක මෙහෙම නඩුවක් විභාග කරන්න පුළුවන් බව ඔප්පු කළා. විනිසුරුවරු නිවාඩු දින, ශෝක නිවාඩු දින නිසා නඩුව කල් යවමින් තිබුණා. මට මේ නඩුව වෙනුවෙන් මගේ ජීවිතයේ වැයවුණු මහන්සිය සහ කාලයට මිලක් නියම කරන්න බැහැ. මමත් නීතිඥයෙක් නිසා මට නීතිඥයන්ට ගෙවන ගාස්තු ගෙවීමට අවශ්‍ය වුණේ නැහැ. එහෙම ගෙව්වා නම් විශාල වියදමක් දරන්නට මට සිදුවෙනවා. මෙයට ප්‍රධානම හේතුව ඉන්දීය අධිකරණයේ මන්දගාමී බවයි. මට ලැබුණු වන්දිය ඉතා කුඩා මුදලක්. මේ නඩුව නිසා මගේ සිතේ ඇතිවූ කම්පාව ඉවරයක් නැහැ.

අපේ රටේ අධිකරණය මන්දගාමී වන අතර මිනිසුන්ට යුක්තිය ඉටු නොවන්නේ ඔවුන්ට කාලය සහ ඉවසීම නොමැති බැවිනි. නමුත් මම අරගල කළේ නැහැ. මොකද මම නීතිඥයෙක් නිසා මගේ නඩුව ඉවසීමෙන් ඉදිරියට ගෙන ගියා...'

> **චතුර්වේදි දැනගෙන සිටියා කොපමණ කාලයක් ගතවී හෝ මේ නඩුවෙන් තමන් ජය ගන්නා බව. මිනිසුන්ගේ දුක්ගැනවිලි ගැන ඉන්දියානු පාරිභෝගික අධිකරණය කටයුතු කරනවා. ඒත් ඔවුන්ට ඒ සඳහා දීර්ඝ කාලයක් ගතවනවා. ඒ, රටේ පවතින මන්දගාමී පරිපාලනය නිසයි.**

ඔහුගේ නඩුව තේරුමක් නැති බවත් කාලය හා මුදල් නාස්තියක් බවත් ඔහුට ඒත්තු ගැන්වීමට ඔහුගේ පවුලේ අය කිහිප වතාවක් උත්සාහ කළ බවද ඔහු පැවසා තිබුණා.

'මගේ ළමයි නිතරම ඇහුවේ ඇයි මම රණ්ඩු වෙන්නේ කියලා. නමුත් මට මගේ මුදල් වටිනවා. අපි අන් අයගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරමු. අපි අසාධාරණයකට මුහුණ දී ඇත්නම්, අපි අපේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් නොකරන්නේ ඇයි?' ඔහු ඔවුන්ගෙන් ප්‍රශ්න කළා.

දීර්ඝ සටනකින් පසුව තීන්දුව ලබාදුන් අධිකරණය, ඉන්දියානු රුපියල් 15,000ක මුදලක් (ශ්‍රී ලංකාවේ මුදලින් රුපියල් 69,000ක්) ගෙවන ලෙසද, 1999 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වසරකට 12%ක පොලියද සහිතව ඉන්දියානු රුපියල් 20ක මුදල චතුර්වේදිට ආපසු ගෙවන ලෙසද දුම්රිය දෙපාර්තමේන්තුවට නියෝග කර තිබුණා. ඒ වගේම මෙම මුදල දින 30ක් තුළ නොගෙව්වොත් පොලී අනුපාතය 15% දක්වා සංශෝධනය කරන බවද වැඩිදුරටත් අධිකරණය දුම්රිය දෙපාර්තමේන්තුවට දැනුම් දී තිබුණා.







චතුර්වේදි දැනගෙන සිටියා කොපමණ කාලයක් ගතවී හෝ මේ නඩුවෙන් තමන් ජය ගන්නා බව. මිනිසුන්ගේ දුක්ගැනවිලි ගැන ඉන්දියානු පාරිභෝගික අධිකරණය කටයුතු කරනවා. ඒත් ඔවුන්ට ඒ සඳහා දීර්ඝ කාලයක් ගතවනවා. ඒ, රටේ පවතින මන්දගාමී පරිපාලනය නිසයි.

චතුර්වේදිගේ ළඟම මිත්‍රයකුද මෙම ජයග්‍රහණය ගැන අදහස් පළ කර තිබුණේ මෙලෙසින්.

'සර් කාලයක් තිස්සේ ජනතාව වෙනුවෙන් යුක්තිය සහ සත්‍ය පසුපස හඹාගිය කෙනෙක්. ඔහු හැමතිස්සේම සටන් කළේ වෙන කෙනකුගේ යහපත වෙනුවෙන් හරි තමන්ට සිදුවූ අසාධාරණයක් වෙනුවෙන්. සමාජයට කළ මෙහෙවර වෙනුවෙන් ඔහුට ගොඩක් සම්මාන හිමිව තියෙනවා.

1971 දී ඉන්දු - පාකිස්තාන යුද්ධයේදී ඔහු කළ මෙහෙවර වෙනුවෙන් සංග්‍රාම පදක්කමද ලැබී තිබෙනවා. ඔහුට ඒ වන විට අවුරුදු 15ක් විතර ඇති. ඔහු මිනිසුන්ට ජලය සහ ආහාර ලබාදීමට උදව් කළා. එකල පැවැති රජයට සහ පරිපාලනයට සහාය වීමට මිනිසුන් අතර සාමය පවත්වා ගැනීමට සහාය දුන්නා. එයාට අවශ්‍ය වුණේ ඇත්තෙන්ම මුදල් නොවෙයි. මේ රටේ දූෂණයට එරෙහිව නැඟී සිටින්නටයි. රටේ දූෂණය තුරන් කරන්නයි...'

අවසානයේ චතුර්වේදි තම රටේ ජනතාවට අවධාරණය කළේ පුද්ගලයකුගේ තානාන්තරය කුමක් වුවත් ඔවුන්ගේ වැරදි සහ දූෂණයට එරෙහිව නැඟී සිටිනවා නම් කිසිවකුට වැරදි කර ඉන් ගැළවෙන්න බැරි බවයි. සටන කොයි තරම් අපහසු වුණත් ජීවිතය පවතින තුරු සටන අත්නොහැරිය යුතු බව චතුර්වේදි තමාගේ මෙම නඩුව මගින් සියලු දෙනාට අගනා ආදර්ශයක් ලබාදුන්නා.

> **අපේ රටේ අධිකරණය මන්දගාමී වන අතර මිනිසුන්ට යුක්තිය ඉටු නොවන්නේ ඔවුන්ට කාලය සහ ඉවසීම නොමැති බැවිනි. නමුත් මම අරගල කළේ නැහැ. මොකද මම නීතිඥයෙක් නිසා මගේ නඩුව ඉවසීමෙන් ඉදිරියට ගෙන ගියා...'**

අපේ රටේ වුවත් මෙවැනි අසාධාරණකම් දිනපතාම පාහේ සිදුවන බව අප ඕනෑ තරම් දක තිබෙනවා. උදාහරණයක් ලෙස පොදු ප්‍රවාහන බස් රථවල ඉතිරි මුදල් නොදී මඟහැරීමට කොන්දොස්තරවරුන් බොහෝ විට කටයුතු කරනවා. එහෙත් ඊට එරෙහිව හඬ නගන්නේ කලාතුරකින් කෙනෙක් පමණයි. එලෙස මගීන්ගෙන් වංචනිකව එකතු කරගන්නා මුදල දිනෙකට ඉතා විශාල අගයක් ගන්නවා විය හැකියි. දුක් මහන්සියෙන් උපයාගන්නා මුදල අසාධාරණ ලෙස කොල්ලකන මෙවන් කොන්දොස්තරවරුන්ට එරෙහිව හඬ නැඟීම සියලු දෙනාම සතු අයිතියකි. එමගින් මගී ජනතාවට ඉතිරිවන මුදල සුළුපටු නොවනු ඇත.







**නිලන්ති රේණුකා**

කතුවැකිය

රටම ඉල්ලන්නේ සර්ව පාක්ෂික ආණ්ඩුවක් නොව සියල්ලන්ටම එකඟ විය හැකි සර්ව පාක්ෂික වැඩපිළිවෙළකි. ජනාධිපතිවරයා පත්ව මාසයක් ඉක්ම ගියත් තවම එවැන්නක සේයාවක් හෝ නොමැති වීම කනගාටුවට කරුණකි.

ලිපිනය
නො: 22, ජයරත්න මාවත,
කොළඹ 05

බෙදාහැරීම්
0114349981

දැන්වීම්
0114349983

කර්තෘ මණ්ඩලය
0112505134
0114349982

කාණ්ඩය 4

කලාපය 11

ඊමේල්
news@mawratanews.lk

වෙබ් අඩවිය
www.mawratanews.lk

මව්රට

# SLPP-SLFP-UNP ඉවරයි
# 2024 සටන SJB සහ JVP




## මොළ හතෙන් කළඳක් තිබුණා නම් මෙහෙමත් දන් දෙයිද?

## එදා අගමැතිකම ගත්තා නම් අද

'මට අවශ්‍ය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ චීනයේ කොමියුනිස්ට් පක්ෂය වගේ ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂය වගේ හදන්න...'

මේ, බැසිල් රාජපක්ෂ 2021 දෙසැම්බර් 04 වැනිදා 'ද හින්දු' පුවත්පතට කළ ප්‍රකාශයය.

'බැසිල්ගේ බේබි පක්ෂය ඓතිහාසික සුපිරි ජයග්‍රහණයක් ලබාගනී...'

මේ, 2020 මහ මැතිවරණයට පසු විදේශ මාධ්‍ය පොදුජන පෙරමුණේ ජයග්‍රහණය නිර්වචනය කළ ආකාරයය.

'අපි පක්ෂ 70ක් ඡන්ද ගත්තොත් දෙවැනි වැඩිම ඡන්ද ගන්න පක්ෂය ලක්ෂ 35ක් වත් ගන්නෙ නැහැ...'

මේ, 2020 මහ මැතිවරණයට කලින් බැසිල් රාජපක්ෂ වාගාඩම්බර පා පළ කළ අනාවැකියය.

මෙහෙව් පොදුජන පෙරමුණ නොහොත් පොහොට්ටුවට 2022 නොවැම්බර් මාසයට වසර 06ක් සම්පූර්ණ වේ. බැසිල් චීන කොමියුනිස්ට් පක්ෂය වගේ, භාරතීය ජනතා පක්ෂය වගේ හදන්න ගිය පොහොට්ටුව අද ජනාධිපති ධූරයත් අහිමි, අගමැති ධූරයත් අහිමි, විපක්ෂ නායක ධූරයක් පමණක් නොව කතානායකත්වයත් අහිමි පක්ෂයක් බවට පත්ව තිබේ. පොහොට්ටුව පිහිටෙව්වේම රනිල් වික්‍රමසිංහගේ නායකත්වයට එරෙහිවය. ඔහුගේ ප්‍රතිපත්තිවලට එරෙහිවය. එහෙව් පක්ෂය අද රනිල්ව නායකත්වයට හයර් කරන තරමට බංකොලොත් වී තිබේ.

ලංකාවේ දේශපාලන ඉතිහාසයේ ජනාධිපතිවරු හයර් කරන වැඩේ පටන් ගත්තේ රනිල්ය. ඒ, රනිල්ට ජනාධිපතිවරණ දිනන්න බැරි නිසාය. 2010 ජනාධිපතිවරණයේදී රනිල් ජනාධිපති අපේක්ෂකත්වයට

### බී.ආර්. කියන්නේ ජේ.ආර්.ගේ අවතාරයද?

හයර් කළේ ෆොන්සේකාවය. 2015 රනිල් ජනාධිපති අපේක්ෂකත්වයට හයර් කළේ මෛත්‍රීපාලවය. ෆොන්සේකා 2009 යුද්ධය දින්න හමුදාපතිය. මෛත්‍රීපාල 2014 වන විට ලක්ෂ 48ක් ඡන්ද ගත්ත ශ්‍රීලනිපයේ මහ ලේකම්ය. ඒත් රනිල් ජනාධිපති වී ඒ ජනාධිපති ධූරය ෆොන්සේකාට හෝ මෛත්‍රීපාලට බන්දේසියක දමලා දුන්නේ නැත. ඔහු අපේක්ෂකකම දුන්නා පමණි. දිනන වගකීම තිබුණේ ෆොන්සේකාට හා මෛත්‍රීපාලටය. මෛත්‍රී, ජනාධිපතිවරණය අමාරුවෙන් දින්නාට පසුත් රනිල් මන්ත්‍රී ආසන 45ටත් අඩුවෙන් තිබ්බ යූ.ඇන්.පී.යට අගමැති ධූරයත් ආණ්ඩුවේ ප්‍රබලතම ඇමැති ධූරත් ඕනෑ කීවේය. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් විධායක බලතල කපන්න ඕනෑ කීවේය. මෛත්‍රී ඒ කියන හැම දේම කළේය. ආසන 45ටත් අඩුවෙන් තිබ්බ රනිල්ව අග මැති කළේය. තමන් සතු විධායක බලතල රනිල්ට පවරා දුන්නේය.

'අනේ ඉතින් බැසිල් චීන මහා ප්‍රාකාරය වගේ හදනවා කිව්ව පොහොට්ටුවෙන් රනිල්ව ජනාධිපති කරලා රනිල්ට ඕනෑ විදියට අගමැති, ඇමැති ධූර පත්කරගන්න දීලා කොහොම හරි තුනෙන් දෙක හදලා සම්මත කරගත්ත 20 විධායක බලතලත් දීලා වත්ත බද්දට දී ඇස්සට දත නියව නියවා ඉන්නේ ඇයි...?'

පොහොට්ටුව හදලා 2019 ජනාධිපතිවරණය ජයගත්තාට පස්සේ හැමෝම බැසිල්ට කීවේ බී.ආර්. යනු ජේ.ආර්.ගේ අවතාරය කියාය. ලංකාවේ දේශපාලනයේ මහමොළකරු කියාය. බැසිල්ට මොළ හතක් තියෙනවා යැයි පොදුජන පෙරමුණ කීවේය.

'ඒ මොළ හත කෙසේ වෙතත් තියෙන මොළය පාවිච්චි කරලවත් තමන්ගේ පක්ෂයේ මන්ත්‍රීවරයකුට ඇමැති ධූරයක් අරන් දෙන්න බැරි තරමට බැසිල් බංකොලොත් වුණේ කොහොමද?'

බැසිල් නොව බංකොලොත් වෙලා තියෙන්නේ පොදුජන පෙරමුණය. පොදුජන පෙරමුණ අද සීසීකඩය. කෑල්ලක් රනිල්ගෙන් ඇමැතිකම් ගන්න රනිල් එක්කය. තව කෑල්ලක් බැසිල් එක්කය. තව කෑල්ලක් ඩලස් එක්කය. තව කෑල්ලක් විමල්ලා එක්කය.

ජනාධිපතිකමත් ආණ්ඩුවත් බැසිල්ලා රනිල්ට දුන්නේ සමගි ජන බලවේගය කඩලා බිඳලා සජිත්ව ඉවර කරලා අරගලය ඉවර කරන්න යැයි කියා හිත හදාගත්තා පොහොට්ටුකාරයන් සිටී. එයින් පොදුජන පෙරමුණ, සමගි ජන බලවේගය සහ අරගලය එක්ක තිබුණු වෛරය පරිමහගත්තා යැයි ඔවුන් සැනසෙයි. තරහ පිරිමහන්න මුහුණත් එක්ක තරහට නහය කපාග ත්තේ නැත. පොහොට්ටුව කරගෙන තියෙන්නේ ඒකය. 1970-1977 මැතිනිය යූ.ඇන්.පී.ය දෙකඩ කරන්න රුක්මන්ව පාවිච්චි කළාය. හැබැයි අගමැතිකම් දුන්නේ නැත. ජේ.ආර්., ශ්‍රීලනිපය දෙකඩ කරන්න අනුරව පාවිච්චි කළේය. හැබැයි අගමැතිකම් ජනාධිපතිකම් දුන්නේ නැත. මහින්දත්, යූ.ඇන්.පී.ය දෙකඩ කරන්න කරුව පාවිච්චි කළේය. හැබැයි දුන්නේ රාජ්‍ය පරිපාලන ඇමැතිකමය. විපක්ෂය කඩන්නයි, විපක්ෂ අරගලවලින් පලිගන්නයි ජනාධිපතිකම්, අගමැතිකම්, ආණ්ඩුව රාජ්‍ය මාධ්‍ය ඔක්කොම දන්දෙන මරිමෝඩ පක්ෂ ලොවේ තියා ලොව් ගහේවත් නැත.

'පොහොට්ටුවටත් ඊළඟ ඡන්දෙදී අලියාට වෙච්ච දේම වෙයිද...?'

පේන්නේ ඒ වගේය. යූ.ඇන්.පී.ය විනාශ වුණේ රනිල් තමාගෙන් පිට කිසි කෙනකුට යූ.ඇන්.පී. නායකත්වය දෙන්නේ නැහැ කියන මතයේ සිටි නිසාය. ඒ වගේම තමාට ජනාධිපති ධූරය හෝ අගමැති ධූරය නොලැබෙන්නේ නම් යූ.ඇන්.පී.යේ කාටවත් ජනාධිපති ධූරය හෝ අගමැති ධූරය ගන්න ඉඩ දෙන්නේ නැහැ කියන මතයේ සිටි නිසාය. ඔහු 2010 ෆොන්සේකාවත්, 2015 මෛත්‍රීපාලවත් හයර් කළේ ඒ මතයේ සිටගෙනය. ජනතාව යූ.ඇන්.පී.ය ෆයර් කළේ ඒ හයර් එක නිසාය.

'මහ බැංකු හොරකමට එරෙහිව කොටි ඩයස්පෝරාවට ඔක්සිජන් දීමට එරෙහිව ඥානසාර හිමි හිරේ දමා මුස්ලිම් අන්තවාදීන් හුරතල් කිරීමට එරෙහිව දෙමළින් ජාතික ගීය ගැයීමට එරෙහිව රාජ්‍ය සම්පත් විකිණීමට එරෙහිව රනිල්ගේ ආණ්ඩුව පරද්දන්න තීරණය කළ ලක්ෂ 69ට පස්ස පෙන්නා ඒ ලක්ෂ 69 දුන්න ජනාධිපතිකමට රනිල්වම හයර් කරලා, ඒ ලක්ෂ 69 පොහොට්ටුව ෆයර් කරයිද?

බැසිල්ම පොහොට්ටුව හදලා බැසිල්ම පොහොට්ටුව විනාශ කරගෙන ඉන්නේ රනිල් වගේ හිතන්න ගිහිල්ලාය. ඒ කියන්නේ රාජපක්ෂලාගෙන් පිට කාටවත් ජනාධිපතිකම් අගමැතිකම් ගන්න බැහැ කියලා හිතන්න ගිහිල්ලාය. බැසිල්ලා අගමැතිකමටවත් පොහොට්ටුවෙන් මන්ත්‍රීවරයෙක් යෝජනා නොකළේ පොහොට්ටුවේ මන්ත්‍රීවරයෙක් අගමැති වුණොත් ඔහු වටා පොහොට්ටුව රොක් වෙයි කියන බයටය. මේ රනිල්ට තිබුණ ලෙඩේය. දැන් ඒ ලෙඩේ බැසිල්ට බෝවී ඇත. පොහොට්ටුව ඉවර වෙන්නේ ඒ ලෙඩෙන්ය.

1994 වනතෙක් ලංකාවේ ලොකුම පක්ෂය යූ.ඇන්.පී.යය. 1994ට පසු යූ.ඇන්.පී.ය එන්න එන්න කුඩා විය. ශ්‍රීලනිපය අති දැවැන්ත පක්ෂයක් විය. 2014 ශ්‍රීලනිපය විනාශ කළේ රනිල්ය. ඒ, මෛත්‍රීපාලව ජනාධිපති අපේක්ෂකත්වයට හයර් කරලා ශ්‍රීලනිපය සමග ජාතික ආණ්ඩුවක් හදන්න ගිහිල්ලාය. පොදුජන පෙරමුණ බිහිවූයේ එහි ප්‍රතිඵලයක් ලෙසය. රනිල්, මෛත්‍රීව හයර් කරන්න ගිහින් යූ.ඇන්.පී.යත් නැත්තටම නැතිකර ගත්තේය.

'ඇයි දැන් රනිල් ජනාධිපති වෙලා යූ.ඇන්.පී.ය ගොඩගන්න බැරිද...?'

මෛත්‍රී, රනිල්ගේ ජනාධිපති අපේක්ෂකයා වූ දින සිට ශ්‍රීලනිප පාක්ෂිකයන් මෛත්‍රීට වෛර කළේ කෙසේද, අද රාජපක්ෂලා රනිල්ව ජනාධිපති කරගත් දින සිට යූ.ඇන්.පී.කාරයා වෛර කරන්නේ රනිල්ටය. එදා මෛත්‍රී එකතු වුණේ ශ්‍රී ලංකාකාරයාගේ හතුරා රනිල් එක්කය. අද රනිල් එකතු වී ඇත්තේ යූ.ඇන්.පී.කාරයාගේ හතුරා රාජපක්ෂලා එක්කය. රනිල්, රාජපක්ෂලාගෙන් ජනාධිපතිකම ගැනීමෙන් රනිල්ට 2020 යූ.ඇන්.පී.කාරයෝ දුන්න ඡන්ද ටිකවත් ලැබෙයිද කියා හිතන්න බැරිය. රනිල්, රාජපක්ෂලා සන්ධානගත වීමෙන් ශ්‍රීලනිපයට 2019 සහ 2020 පොහොට්ටුවට ලැබුණු කොටි ඩයස්පෝරාවට එරෙහි, මුස්ලිම් අන්තවාදයට එරෙහි, රාජ්‍ය දේපොළ විකිණීමට එරෙහි ඡන්ද ටිකවත් ඩැහැගැනීමට හැකියාව තිබිණි.

'මට ජනාධිපති වෙන්න උදව් කළත් මම රනිල් ප්‍රතිග ාමී නිසා රනිල්ව විනාශ කළා. රාජපක්ෂලා රනිල්ව ජනාධිපති කළා...'

මෛත්‍රීපාලට පොහොට්ටු ඡන්ද පදනමට මෙලෙස කිව හැකිව තිබිණි. ඒත් මෛත්‍රී, රාජක්ෂලාට වඩා හයියෙන් රනිල්ට කඩේ යන්න පටන්ගෙන තිබේ. ඒ කියන්නේ ශ්‍රීලනිපයත් ඉවරය. දැනටමත් රාජපක්ෂලා සහ රනිල් පක්ෂය කඩලා ඉවරය. පක්ෂය සීසීකඩය.

'පොහොට්ටුවත් අලියාත් අතත් ඉවර නම් මොකක්ද ඉතුරු වෙලා තියෙන්නේ...?'

අද ලංකාවේ තියෙන විශාලතම පක්ෂය සජිත්ගේ සමගි ජන බලවේගයය. සමගි ජන බලවේගයට අභියෝග කළ හැකි පක්ෂය ජනතා විමුක්ති පෙරමුණය. මේ ටික දැනනෙ රනිල් සහ රාජපක්ෂලා බලන්නේ සමගි ජන බලවේගය කඩා බිඳ දමන්නටය. ඒත් පක්ෂය එකට තියාග න්න සජිත් දෙන්නේ මාරාන්තික සටනකි. අද සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරු රනිල්ගේ ගෝලයන්ය. රනිල් දේශපාලනයට ගෙන ආ අයය. රනිල්ට නායකතුමා කී අයය. ඔවුන් බොහොමයකගේ දේශපාලනයේ අවසානය ප්‍රබල ඇමැති ධූරයකි. අද රනිල් ඇමැති කට්ට පෙන්න පෙන්නා ඔවුන් බාගන්න පැය 24ම ගේම් ගසයි. රාජපක්ෂලා ඒකට අත් උදව් දෙයි. රනිල් ජනාධිපති වූ දින සිට අද දක්වා රාජපක්ෂලාට කඩේ යන මාධ්‍ය සහ වෙබ් අඩවිවලට ලොකුම ප්‍රවෘත්තිය සමගි ජන බලවේග යේ මන්ත්‍රීවරු කඩාගෙන යන ප්‍රවෘත්තියය. ඔවුන්ට අනුව අද රටේ ආර්ථික අර්බුදයක් නැත. බඩු මිල ප්‍රශ්නයක්ද නැත. එකම ප්‍රශ්නය සමගි ජන බලවේගය කඩන්නේ කොහොමද කියන එකය.

මේ රාජපක්ෂ මාධ්‍ය මාෆියාව, රනිල්ගේ ඇම, රාජපක්ෂලාගේ අවතාර මැද සජිත් කොහොම හරි පක්ෂය කඩන්න දෙන්නේ නැතුව රැකගෙන සිටී. සජිත්, රනිල්ට කලින් දුවලා ගිහින් අගමැති ධූරය ගත්තා නම් සජිත් ජනාධිපති වෙන්නේ නැත. එහෙනම් ගොඩ යන්නේ ගෝඨාය. ගෝඨා අදටත් ජනාධිපතිය. සජිත් ඇතුළු

### ස.ජ.බ. මන්ත්‍රීවරු තීරණය කළ යුතු දේ

විපක්ෂයෙන් අයි.එම්.එෆ්. ගොඩදමාගෙන ජාත්‍යන්තරය ගොඩදමා ගෙන ගෝඨා සජිත්ට ගහලා පන්නනවා මිසක් සජිත්ට ජනාධිපති වෙන්න බැරිය. සජිත් එදා අගමැතිකම භාරගත්තා නම් අරගලය සටන මොට කරගෙන අකුළාගෙන යන්නේ එදාමය. සජිත් බැලුවේ මාස කිහිපයකට රාජපක්ෂලාගේ පිහිටෙන් අගමැති වෙන්න නොව 2024 මහජන වරමකින් ජනාධිපති වෙන්නටය. අද රනිල්ගේ ආණ්ඩුවේ ඇමැතිකම් භාරගන්න අයටත් වෙන්නේ රාජපක්ෂලාගේ පිහිටෙන් ඇමැතිකමේ සිට 2024 දේශපාලනයෙන් විශ්‍රාම යන්නටය.

'රාජපක්ෂලාගේ පිහිටෙන් මාස කිහිපයකට ඇමැතිවරු වෙනවාද? මහජන වරමෙන් ශක්තිමත් ආණ්ඩුවක ප්‍රතිපත්ති රකිමින් වසර 05කට ඇමැතිවරු වෙනවාද...?'

අද සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරු තීරණය කළ යුත්තේ ඒකය.

'රාජපක්ෂලාගේ පව් ඇදලා රනිල්ගේ ආණ්ඩුවේ නන්නත්තාර වෙනවාද...?'

සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරු තමන්ගෙන්ම අහන්න ඕනෙ ප්‍රශ්නය ඒකය. අද පක්ෂ නායකයෝ අතරමංය. රනිල් මොන පක්ෂයේ නායකයාද කියා හොයන්න බැරිය. මහින්ද මොන පක්ෂයේ නායකයාද කියා හොයන්න බැරිය. අද ඉන්නේ නායකයෝ දෙන්නෙකි. එක්කෙනෙක් සමගි ජන බලවේගයේ නායක සජිත්ය. දෙවැන්නා ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාරය. 2024 ආණ්ඩුවයි විපක්ෂයයි බෙදාගන්නේ මේ දෙන්නාය.




**උපුල් ජෝශප් ප්‍රනාන්දු**



# ඇමැතිකම්වලටද?
# වරදානවලටද?
# වරප්‍රසාදවලටද?



# රට වෙනුවෙන්
# පැත්ත මාරුකිරීම හෙවත් දැත් ශක්තිමත් කිරීම

**මිනිසුන් මිලකර විකිණීම ලෝකය අතහැර දැමූ පිළිකුල් වෙළෙඳාමකි. අතීතයේ වහල් වෙළෙඳාම යැයි කීවේ එයටය. එහෙත් මිනිසෙක් ස්ව කැමැත්තෙන් තමා විසින්ම මිලක් නියම කර විකිණෙන්නේ නම් එය වෙනමම තත්ත්වයකි. ලෝකයේ අන් රටවල කෙසේ වෙතත් ලංකාවේ එයට කියන්නේ 'දැත් ශක්තිමත් කරන්නට' යනවා කියාය. මෙකී දැත් ශක්තිමත් කරන්නට යෑම ලංකාවේ දේශපාලන සංස්කෘතියට එක්වනුයේ 1994න් පසුවය. චන්ද්‍රිකාගේ කාලයේය.**

රාජ්‍ය මන්ත්‍රණ සභා, ව්‍යවස්ථාදායක සභා පසුකර ගාලුමුවදොරින් දියවන්නාවට පාර්ලිමේන්තුවට සපැමිණීම හුදු ගොඩනැගිලි මාරුවක් ලෙස සැලකිය නොහැක්කේ එකී ස්ථාන මාරුවෙන් කෙටි කලක ඇවෑමෙන් පෞද්ගලික වාසි තකා පක්ෂ මාරුකිරීමේ පහත් පුරුද්ද දැත් ශක්තිමත් කිරීම නමින් බෞතීස්ම ලබා කරළියට පැමිණීම නිසාය.

ප්‍රතිපත්ති මූලික ක්‍රියාකාරකමක් වූ දේශපාලනඥයකුගේ තීරණ සහ ප්‍රතිපත්ති වෙනස් වනවා නම් ඒ ජනතා සුබසෙත සදන කරුණක් වෙනුවෙන් පමණක් විය යුතුය. ලාභ ප්‍රයෝජන තකා කිසිම විටෙක එකී ප්‍රතිපත්ති වෙනස් නොවිය යුත්තේය. එහෙත් වර්තමානයේ දැත් ශක්තිමත් කිරීමට යැයි කියා කරන පක්ෂ මාරුව තනිකරම සිදුවන්නේ පුද්ගලික වාසි තකාය. එමෙන්ම පවතින දේශපාලන රාමුව විසින් නිර්මිත විකාරරූපී ඡන්ද ක්‍රමය නිසාද දැත් ශක්තිමත් කරන්නන්ට හොඳ ඉඩ හසරක් නිර්මාණය කර තිබේ.

අතීතයේ පක්ෂ මාරුකිරීමේ කප්පිත්තන් වූ රොනී ද මැල් වැන්නෝ එකල මෙලෙස උප සංස්කෘතියක් බිහි කළද ඔවුන්ට තවත් තැනක දේශපාලන වශයෙන් ස්ථාවර වීම හැර වෙනත් මූල්‍ය වාසියක් හෝ තනතුරු ලාභයක් හිමිවූයේ නැත. එ.ජා.ප.ය වෙනුවෙන් අඛණ්ඩව අයවැය ලේඛන 11ක් පර්ලිමේන්තුවට ඉදිරිපත් කළ රොනී 1990දී



ශ්‍රීලනිපයට එක්වී නැවත 1994දී එ.ජා.ප.යට එක්වන්නේය. 2001දී පොදුජන එක්සත් පෙරමුණට එක්වූ ඔහු ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙක් ලෙස පාර්ලිමේන්තුවට එක් වන්නේය. 2004 වසරේ රොනී යළි එක්සත් ජාතික පක්ෂයට එක්වූයේය. මෙතරම් කරණම් ගැසුවද ඔහු රුපියල් කෝටි ප්‍රකෝටි ගණනට අලෙවි වූ බව අපට චෝදනා කළ නොහැක. එහෙත් මෑත භාගයේ සිදුවූ සියලු දේශපාලන පැති මාරු පසුපස ඇත්තේ එදා රොනීලාගේ කාලයේ මෙන් සරල කරණම් නොව බරැති දේශපාලන ගනුදෙනුය.

1994 පාර්ලිමේන්තු මැතිවරණය ජයගත්තද චන්ද්‍රිකා බණ්ඩාරනායක පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව පසුවූයේ හෙළවෙන දතක ස්වරූපයෙනි. එක බහුතර ආසනයක් සහිතව පිහිටුවූ ඇගේ ආණ්ඩුව ස්ථාවර කරන්නට 'දැත් ශක්තිමත් කරන්නන්' සොයාගත හැකි වූයේ එ.ජා.පයෙනි. විජයපාල මෙන්ඩිස්, ආචාර්ය සරත් අමුණුගම, සුසිල් මුණසිංහ ප්‍රමුඛ කණ්ඩායමක් චන්ද්‍රිකාගේ ආණ්ඩුවට එක්වීමෙන් ලංකාවේ මුල්ම දැත් ශක්තිමත් කරන්නෝ බවට පත්වූහ.

**1994 පාර්ලිමේන්තු මැතිවරණය ජයගත්තද චන්ද්‍රිකා බණ්ඩාරනායක පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව පසුවූයේ හෙළවෙන දතක ස්වරූපයෙනි. එක බහුතර ආසනයක් සහිතව පිහිටුවූ ඇගේ ආණ්ඩුව ස්ථාවර කරන්නට 'දැත් ශක්තිමත් කරන්නන්' සොයාගත හැකි වූයේ එ.ජා.පයෙනි. විජයපාල මෙන්ඩිස්, ආචාර්ය සරත් අමුණුගම, සුසිල් මුණසිංහ ප්‍රමුඛ කණ්ඩායමක් චන්ද්‍රිකාගේ ආණ්ඩුවට එක්වීමෙන් ලංකාවේ මුල්ම දැත් ශක්තිමත් කරන්නෝ බවට පත්වූහ.**

1977 පාර්ලිමේන්තු මතිවරණයට කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් හඟුරන්කෙත ආසනයට තරග කරමින් අන්ත පරාජයක් ලැබූ එස්.බී. දිසානායකද තවත් ප්‍රකට දැත් ශක්තිමත් කරන්නෙකි. ශ්‍රීලනිපය වෙනුවෙන් තරග කරමින් 1994 මහ මැතිවරණයේදී පාර්ලිමේන්තුවට පිවිසි ඔහු චන්ද්‍රිකාගේ මුල්ම කැබිනට්ටුවේ ක්‍රීඩා සහ සමෘද්ධි ඇමැති ධුරය හෙබවීය. එහෙත් වසර 2000 වන විට ඔහුට චන්ද්‍රිකා වහ කදුරු මෙන් වූ අතර විකල්පය ලෙස එස්.බී. තෝරා ගත්තේ රනිල්ගේ දැත් ශක්තිමත් කිරීමය. එදා එස්.බී. සමග මහාචාර්ය ජී.ඇල්. පීරිස්, බන්දුල ගුණවර්ධන, රාජිත සේනාරත්න ඇතුළු පිරිසක් සමග එක්සත් ජාතික පක්ෂයට එක්වී රනිල්ගේ දැත් ශක්තිමත් කරන මුවාවෙන් ආණ්ඩුවක්ද අටවා ඇමැතිකම්ද ලබාගන්නට සමත් වන්නේය.

රනිල්ගේ දැත් ශක්තිමත් කරමින් සිටින අතරතුර කළ කතාවකින් අධිකරණයට අපහාසයක් වූ බව තීරණය වීම නිසා 2004 වසරේදී ඔහුට සිරබත් කන්නටද සිදුවන්නේය. එහෙත් එස්.බී. වැනි දැත් ශක්තිමත් කරන්නකු හිරේ ඉන්නවාට අකැමැති වූ මහින්ද රාජපක්ෂ, 2006 වසරේදී ඔහුට සමාව ලබාදෙන ලදී. අනතුරුව 2009 වසරේ යළි ශ්‍රීලනිපයට එක්වී මහින්දගේ දැත් ශක්තිමත් කරන ඔහු, 2015 මැතිවරණයේදී පරාජයට පත්වන්නේය.

අද වන විට පොදුජන පෙරමුණේ ක්‍රියාකාරිකයෙක් මෙන්ම හිටපු අගමැති මහින්ද රාජපක්ෂගේ කිට්ටුවන්තම සගයා වී 'මයිනා ගෝ ගම'ට සහ 'ගෝඨා ගෝ ගම'ට මැයි 09 වැනිදා එල්ලවූ ප්‍රහාරයේ හවුල්කරුවෙක් වී මේ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නිතර යනෙන කෙනකු වී සිටින ජොන්ස්ටන් ප්‍රනාන්දුද එ.ජා.ප.යේ සිට මහින්ද රාජපක්ෂගේ දැත් ශක්තිමත් කරන්නට පැමිණි අයෙකි. ඔහු සමග එකම වකවානුවේ එජාපය හැර දමා ශ්‍රීලනිපයට පැමිණි දයාසිරි ජයසේකර මේ වන විටත් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ දැත් ශක්තිමත් කරමින් සිටී.

1960 සිට නම් දැරූ යූ.ඇන්.පී.කාරයකුව සිට 2006 වසරේ රනිල් වික්‍රමසිංහ සමග පෞද්ගලික ආරෝවක් නිසා මහින්ද රාජපක්ෂගේ දැත් ශක්තිමත් කරන්නට ගිය ගාමිණී ලොකුගේ අරගලය විසින් රාජපක්ෂවරු නෙරපන තුරුම කැබිනට් අමාත්‍ය ධුර හෙබවූ අයෙකි. හෙට අනිද්දාට සර්වපාක්ෂික අණ්ඩුවක් පිහිටුවූ පසු ඔහුට 2006 එපා වූ රනිල්ගේ දැත් ශක්තිමත් කරන්නට සිතුණොත් එයද පුදුමයක් නැත.

දැත් ශක්තිමත් කරන්නන්ගේ ලොකුම කණ්ඩායම කලඑළි බසින්නේ 2007 වසරේ ජනවාරි 28 වැනිදාය. කරු ජයසූරියගේ ප්‍රධානත්වයෙන් යුතු මන්ත්‍රීවරු 18 දෙනෙක් එදා එජාපය හැරදමා මහින්දගේ දැත් ශක්තිමත් කිරීමට එක්වූහ. එම පිරිස අතර රෝහිත බෝගොල්ලාගම, පී. දයාරත්න, ලක්ෂ්මන් යාපා අබේවර්ධන, ධර්මදාස බණ්ඩා, නවීන් දිසානායක, එඩ්වඩ් ගුණසේකර, බන්දුල ගුණවර්ධන, මිලින්ද මොරගොඩ, එම්.එච්. මොහොමඩ්, හේමකුමාර නානායක්කාර, නියෝමාල් පෙරේරා, රාජිත සේනාරත්න, ජී.ඇල්. පීරිස්, සී.ඒ. සූරියආරච්චි, මනෝ විජේරත්න, මහින්ද විජේසේකර වූහ. එදා වූ දේ හැටියට එජාපය මේ ගානට තියෙනවා පුදුමය.

එහෙත් මෙලෙස පැමිණි අයගෙන් කරු ජයසූරිය ඇතුළු කිහිප දෙනකුම නැවතත් එජාපයට ගිය බව සඳහන් කරනුයේ අදටත් නිමක් නැති ඔවුන්ගේ දැත් ශක්තිමත් කිරීම පිළිබඳ ඔබට සිහි කිරීමටය.

රජවාසල කවටයා වූ අන්දරේට තමන්ගේ නෑකමක් ඇතැයි පැවසූ මර්වින් සිල්වාද දැත් ශක්තිමත් කිරීමේ රුසියෙකි. ශ්‍රීලනිපයෙන් සිය දේශපාලනය අරඹා ශ්‍රී ලංකා මහජන පක්ෂය හරහා එක්සත් ජාතික පක්ෂයට එන ඔහු, චන්ද්‍රිකාගේ දැත් ශක්තිමත් කරන්නට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එකතු විය. අනතුරුව මහින්ද රාජපක්ෂ සමග සහයෝගයෙන් වැඩ කරන ඔහු, රූපවාහිනී සංස්ථාවට කඩාපැන චණ්ඩිකම් පෙන්වන්නට ගොස් හොඳහැටි ගුටිකා නැවතත් එක්සත් ජාතික පක්ෂයට එකතු විය. දැත් ශක්තිමත් කිරීමෙන් සුපිරියටම ගොඩගිය පුද්ගලයා විමල් වීරවංශය. මහින්දගේ දැත් ශක්තිමත් කරන්නට නොගියේ නම් වීරවංශ දැත් පමණක් නොව දෙපයද දුර්වලවී දේශපාලනයෙන්ද ඉවතට වීසිවන්නට බොහෝ ඉඩකඩ තිබිණි.

කෙසේ වෙතත් මේ ආකාරයට නායකයන්ගේ දැත් ශක්තිමත් කිරීම සඳහා බලපාන තවත් කාරණාවක්ද ඇති බව නොකියාම බැරිය. ඒ, හිටපු අගවිනිසුරු සරත් එන්. සිල්වා මහතා ලබාදී තිබූ නඩු තීන්දුවකි. එම නඩුවෙන් මන්ත්‍රීවරුන්, හෘද සාක්ෂියට අනුව කටයුතු කළ හැකි බවට තීන්දු වූ නිසා වර්තමානයේ මන්ත්‍රීවරු බොහෝ දෙකු සිය පැති මාරුකිරීම් සාධාරණීකරණය කරන්නේ මෙම නඩු තීන්දුව පදනම් කරගෙනය. ඒ අනුව ඉදිරියේදී මෙම පක්ෂ මාරුකිරීම් තහනම් කිරීමට ව්‍යවස්ථාවෙන්ම කටයුතු නොකරන තාක් මේ දැත් ශක්තිමත් කිරීම් තවදුරටත් දැකබලාගත හැකි වනු ඇත.



අරුණ ලක්ෂ්මන් ප්‍රනාන්දු








# එදා යාපනයේ සිංහල මහා විද්‍යාලය
# අද සුප්‍රසිද්ධ තැපැල් පෙට්ටියක් එහෙම වුණේ කොහොමද?

**20 වැනි සියවසේ දශක දෙකකට පසු යාපනයේ ජීවත් වූ සිංහල දරුවන්ට තම මවු භාෂාවෙන් අධ්‍යාපනය ලැබීමට නොහැකි විය. 1930 වසර වන විට බොහෝ සිංහල රාජ්‍ය සේවකයෝ සහ ව්‍යාපාරිකයෝ යාපනය නගරය සහ ඒ අවට ප්‍රදේශවල පදිංචියට පැමිණ සිටියහ. මේ පිරිස අතර බෞද්ධයන් වූ අයට අවශ්‍ය වූයේ යාපනයේ තරුණ බෞද්ධ සංගමය පිහිටුවීමටයි. 1932 වර්ෂයේදී මෙහි පළමු සිංහල පොදු පාසල පිහිටුවීමට අවස්ථාව උදාකර දීමට එක්වූයේ මෙම සංගමයේ සාමාජිකයන්ය. යාපනයේ ආරම්භ කරන ලද කතෝලික දේවස්ථානය අසල රෝහල පාරේ අක්කර භාගයක භූමි භාගයක පාසල ඉදිකර ඇත. ආරම්භයේදීම පාසලේ සිටියේ සිසුන් 17 දෙනකු පමණක් වන අතර එම නිසා 01 වසර සිට 05 වසර දක්වා මට්ටම් අතර පමණක් ඉගැන්වූයේය. ප්‍රධාන අධ්‍යක්ෂ ධුරය හිමිවූයේ දිවංගත එච්.පී.එම්.වයි. විජේසිංහටය. ඇගේ සැමියා එම්.කේ. අමරදාස ද විජේසිංහ සමග පාසලේ ගුරුවරයකු ලෙස සේවය කළේය. එය එවක යාපනයේ රජයේ අනුග්‍රහය ලබන මිශ්‍ර පාසල (යාපනය රාජයේ පෝෂිත සිංහල මිශ්‍ර පාඨශාලාව) ලෙස හැඳින්විණි. එවක පාසලේ පරිපාලකවරයා වූයේ යාපනය හින්දු අධ්‍යාපන කවුන්සිලයේ සාමානයාධිකාරී නීතිඥ එස්. රාජරත්නම් මහතාය.**

විශේෂයෙන්ම සිසුන් වැඩි ප්‍රමාණයක් ගෙන්වා ගැනීමේදී විදුහල්පතිනිය සහ අමරදාස මහත්ම මහත්මීන් පාසලට විශාල සේවයක් කළහ. ඔවුන් යාපනයේ සිංහල වැසියන්ගේ නිවෙස්වලට ගොස් සිංහල අධ්‍යාපනයේ වැදගත්කම ගැන කතා කිරීමට විශාල කාලයක් හා වෑයමක් දැරීය. දහවල් විවේකයේදී සිසුන්ට පෝෂ්‍යදායී ආහාර ලබාදීම සඳහා රජයෙන් සහ පරිත්‍යාගශීලීන් විසින් ලබාදෙන මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමටද ඔවුහු වගබලා ගත්හ. අන්තර් දිස්ත්‍රික් සහ අන්තර් පාසල් ක්‍රීඩා තරග සහ තරගාවලි සඳහා සහභාගි වීමට සිසුන් දිරිමත් කිරීමට ඔවුන් විශාල උත්සාහයක් දරයි. 1938 මැයි 01 වැනි දින පාසල සම්පූර්ණයෙන්ම රජයට පවරා ගන්නා ලද අතර යාපනය රජයේ මිශ්‍ර සිංහල පාසල (ආණ්ඩුවේ සිංහල මිශ්‍ර පාසල, යාපනය) ලෙස හඳුන්වන ලදී. 1939 පෙබරවාරි 26 වැනි දින පාසලේ පළමු ත්‍යාග ප්‍රදානෝත්සවය සිදුවිය. විදුහල්පතිනිය විජේසිංහ මහත්මිය විසින් එවකට උතුරු පළාතේ ප්‍රධාන පාසල් පරීක්ෂක සී.ටී. ලෝරාජ් සහ ඔහුගේ බිරිය උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වූහ. මෙම වසරේම පාසල සඳහා තවත් කැපීපෙනෙන සිදුවීමක් සිදුවිය. එවක අග්‍රාමාත්‍යවරයා සහ කෘෂිකර්ම අමාත්‍යවරයාව සිටි ඩී.එස්. සේනානායක මහතා පාසලට පැමිණ මාණ්ඩලික නේවාසිකාගාරයක් අවශ්‍ය බවට තීරණය කළේය.

1939 අගෝස්තු පළමු දින ඩී.ඒ. කරුණාරත්න, විදුහලේ ප්‍රධාන ගුරුවරයා ලෙසත්, විජේසිංහ සහ අමරදාස යාපනයෙන් මාරුකර යවා ඇත. 1941 වසර වන විට පාසලේ සිසුන් 72ක් සිටි අතර එය 07 වසර දක්වා එහි පන්ති කාමර පුළුල් කරන ලදී. වසර හතකට පසු, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් ලංකාව නිදහස ලැබූ එම වසරේම, පාසලට සිසුන් 183ක් සහ කාර්ය මණ්ඩලය 05 දෙනකු සිටීමේ භාග්‍යය හිමි විය. එවක විදුහල්පතිවරයා වූයේ එම්.බී. බස්නායක මහතාය.

පාසලේ දීර්ඝ හා වර්ණවත් ඉතිහාසයේ තවත් සුවිශේෂ සිදුවීමක් වූයේ 1950 වර්ෂයේදී පාසල සඳහා පළමු දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල්ගල තැබීමයි. මෙය සිදුකරන ලද්දේ අගමැති ඩී.එස්. සේනානායක මහතා විසිනි. 1958 වසර පාසලේ සිසුන්ට සහ ආචාර්ය මණ්ඩලයට අමතක නොවන වසර විය. යාපනය රජයේ සිංහල මිශ්‍ර පාසලට 'මහා විද්‍යාලය' තත්ත්වය හිමි වූ වසර මෙයයි.

එවක පාසලේ විදුහල්පතිවරයා වූයේ බී.එච්.එච්. විමලදාස, සහ එහි කාර්ය මණ්ඩලය 10 දෙනකුගෙන් සමන්විත විය. 1970 දශකයේ මුල් භාගය වන විට පාසල සිසුන් 600කට වැඩි සංඛ්‍යාවක් සිටින පරිදි ව්‍යාප්ත වී ඇති අතර උසස් පෙළ සඳහා කලා, විද්‍යා සහ වාණිජ විෂය ධාරාවන්ද හඳුන්වා දෙන ලදී.

බොහෝ කලකට පසු පාසලට 'මධ්‍ය මහා විද්‍යාල' තත්ත්වය හිමි විය. මෙම දීර්ඝ කාලය තුළ කථික, නාට්‍ය හා ලේඛන තරග, සාමාන්‍ය දැනුම ප්‍රශ්නාවලිය සහ දිස්ත්‍රික්, අන්තර් දිස්ත්‍රික් මට්ටම් සහ ජාතික මට්ටමේ ක්‍රීඩා තරග වැනි ක්ෂේත්‍ර රැසකින් විශිෂ්ට දස්කම් දැක්වූ පාසල දිවයින පුරා ඉමහත් පිළිගැනීමක් ලබාගත්තේය. වඩාත් වැදගත් දෙය නම්, විවිධ ආගමික සහ වාර්ගික පසුබිම්වලින් යුත් සිසුන්ගෙන් යුත් බහු සංස්කෘතික ප්‍රජාව සඳහා පාසල රට තුළ පුළුල් ලෙස පිළිගැනීමට ලක්විය. බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික සහ ක්‍රිස්තියානි ආගම්වලට අයත් දෙමළ, සිංහල, මුවර්, බෝරා, මැලේ සහ බර්ගර් යන ප්‍රජාවන්ට අයත් සිසුන්ට යාපනයේ සිංහල මධ්‍ය මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබීමට හා විෂය බාහිර ක්‍රියාකාරකම්වලට සහභාගි වීමට සම අවස්ථාව හිමි විය. අවාසනාවකට මෙන්, 1985 මැයි මාසයේදී, සිවිල් යුද්ධය පුපුරා යෑමෙන් පසු පාසල විනාශ විය.

මේ වන විට යාපනයේ සිංහල මධ්‍ය මහා විද්‍යාලය පැවැති බව කීමට ඉතිරිව ඇත්තේ ප්‍රසිද්ධ තැපැල් පෙට්ටියක් පමණි.

වත්මන් රජය ප්‍රජාවන් අතර සහජීවනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සිටින අතර, එතෙර මෙතෙර පදිංචිව සිටින J/SMMV හි ආදි ශිෂ්‍යයන් සහ ගුරුවරුන්ගෙන් සමහරෙක් තම ආදරණීය පාසල යළි ගොඩනැගීමට බලාපොරොත්තු වෙති.



විදුනි බස්නායක



# GOTA COME HOME

කපිල පුංචිමාන්නගේ

# රාජ්‍ය රහස්

## නැවේ අර්බුදය උඩු දුවයි...

පසුගිය සතියේ 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ අප අනාවරණ කළ පරිදිම තවත් ජාත්‍යන්තර අර්බුදයකට පාර කපමින් 'යුආන් වැන්ග් 5' චීන ඔත්තු නැවට හම්බන්තොට වරායට පැමිණීම සඳහා අවසර ලබාදීමට ලංකාවේ ආණ්ඩුව පියවර ගැනීම විශේෂ සිදුවීමක් විය. චීන ඔත්තු නැව හම්බන්තොට වරායට පැමිණීම සඳහා අවසර ලබාදීම හේතුවෙන් ඉන්දියාව හා ඇමෙරිකාව දැඩි කලබලයට පත්ව සිටි ආකාරය ඉකුත් සති දෙක තුළදීම 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ රටට අනාවරණ කිරීමට අපි පියවර ගත්තෙමු. එහිදී ඇමෙරිකාවත්, ඉන්දියාවත් නිල වශයෙන් ඒ සම්බන්යෙන් සිය විරෝධය ලංකාවේ විදේශ අමාත්‍යාංශය වෙත පළකර සිටි ආකාරයද අපි පෙන්වා දුන්නෙමු. ඒ අනුව ලංකාවට ඇති විකල්පය ලෙස නැව හම්බන්තොටට ඇතුලු වීම තහනම් කිරීම හෝ නියමිත පරිදි 11 වැනි බ්‍රහස්පතින්දා දිනම ඊට හම්බන්තොටට ඇතුලු වීමට ඉඩ ලබාදීම බව පෙන්වා දුන් අප ඒ හරහා මතුවිය හැකි රාජ්‍යතාන්ත්‍රික අර්බුද ගණනාවක්ද ඉකුත් සතියේ 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ පෙන්වා දීමට පියවර ගත්තෙමු.

කෙසේ වෙතත් මුළු ලෝකයම බලා සිටියේ 11 වැනි දින හම්බන්තොට වරායට අදාළ නෞකාව ඇතුළු වන්නේද නැද්ද යන්න කියාය. මෙහිදී ආණ්ඩුව කිසියම් උපක්‍රමයක් ක්‍රියාවට නංවමින් නෞකාවේ හම්බන්තොට ගමන ප්‍රමාද කරන ලෙස චීනයට දැනුම් දීමක් කළ අතර එම දැනුම් දීමට අනුගත වෙමින් වැන්ග් 5 නෞකාව සිය ගමන මන්දගාමී කිරීමට පියවර ගත්තේය. ඒ අනුව නැව හම්බන්තොට වරායට පැමිණියේ පසුගිය ඉකුත් අඟහරුවාදා (6) දිනය. එම නෞකාව පිළිගැනීම සඳහා පොහොට්ටුවේ මන්ත්‍රීවරුන් වන විමල් වීරවංශ, වාසුදේව නානායක්කාර, සරත් වීරසේකර සහ අතුරලියේ රතන හිමිද හම්බන්තොට වරායට ගොස් සිටීම විශේෂ සිදුවීමක් විය.

## කොහොන කිවුවේ ඇත්තද...

කෙසේ වෙතත් ඇමෙරිකාව සහ ඉන්දියාව යන බලගතු රාජ්‍යයන් වැන්ග් 5 නෞකාවේ පැමිණීමට නිල වශයෙන් විරෝධය පළකොට තිබියදීත් එම නෞකාවට ලංකාවට ඇතුලු වීමට ආණ්ඩුව අවසර ලබාදුන්නේ කුමන හේතුවක් මතද යන්න සම්බන්ධයෙන් මේ වන විට දේශපාලන ක්ෂේත්‍රයේ විශාල කතාබහක් මතුවී තිබේ. බොහෝ දෙනා සඳහන් කර සිටින්නේ චීනයේ ශ්‍රී ලංකා තානාපතිවරයා වන පාලිත කොහොන මහතා වරක් සඳහන් කර සිටි ආකාරයට චීනයෙන් ලංකාවට ඩොලර් බිලියන 4ක ණය මුදලක් හිමිවීමට නියමිතව ඇති බවට කළ ප්‍රකාශයට අනුව එම මුදල් බලාපොරොත්තුවෙන් ලංකා ආණ්ඩුව නැවට පැමිණීමට ඉඩ ලබා දුන් බවකි. කෙසේවෙතත් පාලිත කොහොන යනු රාජපක්ෂ ආණ්ඩු සමයේ චීන තානාපතිවරයා ලෙස පත්කර යැවුණු රාජපක්ෂ පවුලේම ඥාතියෙකි. නමුත් කලක සිටම පාලිත කොහොන විසින් සිදුකරනු ලබන ප්‍රකාශ චීන රජය විසින් හෝ ලංකා ආණ්ඩුව විසින් එතරම් තැකීමක් කරන්නේ නැත. නමුත් චීන තානාපතිවරයා වශයෙන් කොහොන කළ මෙම ප්‍රකාශයෙන් පසු ආණ්ඩුව චීන නැවට ලංකාවට පැමිණීමට ඉඩ ලබා දුන් නිසා බොහෝ දෙනා සිතා සිටියේ කොහොන පැවසූ ඩොලර් බිලියන 4 ඉලක්ක කරගෙන ආණ්ඩුව චීන නැවට ලංකාවට පැමිණීටම ඉඩ ලබා දුන් බවකි. ඒ නිසාම විපක්ෂයේ බොහෝ දෙනා පසුගිය සතියේදී ශ්‍රී ලංකාවේ චීන තානාපතිවරයා වූ කී ෂෙන්හොන්ග් මහතාගෙන් මේ පිළිබඳ විමසීමක් කිරීමට පියවර ගෙන තිබූ බවක් දැකගන්නට ලැබිණි. ආණ්ඩුවට වඩා විපක්ෂයත් සමග ගනුදෙනු පවත්වන තානාපතිවරයකු ලෙස ප්‍රකට කී ෂෙන්හොන්ග් මහතා ඒ සම්බන්ධයෙන් විමසූ අයට ලබා දී තිබුණේ අමුතුම තාලයේ පිළිතුරකි. එහිදී ගත් කටටම ඔහු කියා තිබුණේ ඒ ආකාරයට ණය ලබාදීමට නොහැකි බවත්, ණය ලබාදීමේදී චීනය යම් ප්‍රතිපත්තියක් අනුගමනය කරන බවත්ය.

## චීනය කෝපයෙන් කනස්සල්ලෙන්...



මීට අමතරව චීන තානාපතිවරයා තවත් වැදගත් කාරණයක්ද විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට සඳහන් කොට තිබිණි. ඒ, චීන නැව චීනයෙන් පිටත් වූයේ හම්බන්තොට වරායට පැමිණීම සඳහා ලංකා ආණ්ඩුවේ අවසරය හිමි වීමෙන් පසුව බවත්, එය 11 වැනි දින හම්බන්තොට වරායට පැමිණිටම නියමිතව තිබූ නමුත් ආණ්ඩුවේ විරෝධය හේතුවෙන් අමතර තවත් දින 5ක් මුහුදේ ගතකිරීමට සිදුවූ බවත්, මේ ආකාරයෙන් නැව මුහුදේ අතරමං කිරීම සම්බන්ධයෙන් චීන රජය දැඩි කනස්සල්ලෙන් පසුවන බවත්ය. මෙම සිදුවීම හරහා චීන ආණ්ඩුව කෝපගැන්වීමට ආණ්ඩුව කටයුතු කොට ඇති බවද චීන තානාපතිවරයා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට පෙන්වා දී තිබිණි.

ඒ අනුව එකක් පැහැදිලිය. ඒ, චීන තානාපති පාලිත කොහොන සඳහන් කළ ආකාරයට ඩොලර් බිලියන 4ක ණය මුදලක් ලංකාවට හිමිවීමේ ඉඩකඩක් නොමැති බවකි. ඉන්දියාව සහ ඇමෙරිකාවේ නිල විරෝධය නොතකා චීන නැවට ලංකාවට පැමිණීමට ඉඩ ලබාදීම හරහා ආණ්ඩුව බලාපොරොත්තු වන ආකාරයේ ඉක්මන් සහනයක් නොලැබෙන බවකි.

## ඉන්දියාව දුන්නු ඉඟි...

එසේ නම් චීන නැවට පැමිණීමට ඉඩ ලබාදීම මුල් කරගෙන ඊට විරෝධය පළකළ ඉන්දියාව සහ ඇමෙරිකාව ඉදිරියේදී කුමන ප්‍රතිචාරයක් දක්වනු ඇතිද? මුල් වටයේදී එළිපිට විරෝධය පළකළත් දැනට පෙනෙන ආකාරයට නම් නැවට පැමිණීමට ඉඩ ලබාදීම සම්බන්ධයෙන් ඉන්දියාව සහ ඇමෙරිකාව සිය නිල ප්‍රතිචාරය ඉදිරිපත් කොට නැත. රටවල් දෙකම සිටින්නේ දැඩි නිහඬතාවක ගිලීය. 1987 නම් ඉන්දු ලංකා ගිවිසුම අස්සන් කිරීමට විරෝධය පළවෙද්දී ඉන්දියාව වහාම ලංකාවේ ගුවන් සීමා ආක්‍රමණය කරමින් පැමිණ යාපනයට ගුවනින් පරිප්පු දැමීමට කටයුතු කළේය. සාමසාධක හමුදාව ලංකාවට එවීමට පියවර ගත්තේය. නමුත් වර්තමානයේදී එසේ කළ නොහැකි නිසා බොහෝ දෙනා බලා සිටියේ ඉන්දියාව කුමන ආකාරයේ ප්‍රතිචාරයක් මීට දක්වනු ඇද්ද යන්න කියාය.

කෙසේ වෙතත් ප්‍රසිද්ධියේ සිදු නොකළද ඉන්දියාව ඒ සම්බන්ධයෙන් ඉඟි කිහිපයක් ලබාදීමට පියවර ගත්තේය. එහි පළමු ඉඟිය වූයේ ඉන්දීය වෙරළාරක්ෂක බළකාය මගින් එරට මුහුදු තීරයේ සිදුකරන නාවික සංචාර හිටි හැටියේම ඉහළ නැංවීමය. උතුරේ සිට ඉන්දියානු මුහුදු තීරයට ඇතුළු වන ධීවර බෝට්ටු දැඩි ලෙස පරීක්ෂා කිරීමට යොමු කළ අතර ඒවායේ තිබී යම් යම් පුපුරන ද්‍රව්‍ය සහ ගිනි අවි සොයාගත් බවට ඡායාරූප සහිත පුවත් ඉන්දීය මාධ්‍යවල පළවූ ආකාරයද දැකගත හැකි විය. එමෙන්ම කොටි සංවිධානය නැවත සිය ක්‍රියාකාරකම් තීව්‍ර කොට ඇති බවත්, තමිල්නාඩුව තුළ කොටි සංවිධානය නැවත පණගැන්වීමට කිසියම් පිරිසක් සැලසුම් කර ඇති බවට තොරතුරු වාර්තා වී ඇති බවත් එම පුවත්වලින් වැඩිදුරටත් වාර්තා කොට තිබිණි.

## කච්චතිවු දූපතත් ඉල්ලයි...



ඉන්දියාව පැත්තෙන් ආ දෙවැනි ඉඟිය වූයේ ලංකාවට අයත් කච්චතිව් දූපත යළි ඉන්දියාවට පවරාගත යුතු බවට ඉන්දීය ප්‍රාදේශීය දේශපාලනඥයන් රැසක් හිටි හැටියේම මත ප්‍රකාශ කිරීමට පියවර ගෙන තිබීමය. චීන නැව ලංකාවට පැමිණීම ඉන්දියාවේ ආරක්ෂාවට බරපතළ තර්ජනයක් බව ප්‍රකාශ කර තිබූ ඔවුන්, වහාම කච්චතිව් දූපත ඉන්දියාවට පවරාගෙන ඉන්දියාවේ ආරක්ෂාව තහවුරු කළ යුතු බවට ප්‍රකාශ නිකුත් කිරීමටද පියවර ගෙන තිබිණි. ඉන්දීය ආණ්ඩු මට්ටමින් මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් තවමත් නිකුත් වී නොතිබුණද පහළ මට්ටමින් නිකුත් වන මෙවැනි ප්‍රකාශ මේ මොහොතේදී පහසුවෙන් බැහැර කිරීමේ හැකියාවක්ද නැත.

## ඇමෙරිකාව දැඩි තීන්දුවක...

ඊළඟ තීරණාත්මක සාධකය වන්නේ ඇමෙරිකාවේ ප්‍රතිචාරයය. මේ වන විට අතිශය තීරණාත්මක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාකච්ඡාවන්වලදී සහ ජිනීවා මානව හිමිකම් සැසිවාරයේදී ලංකාවට අත්‍යාවශ්‍ය පාර්ශ්වය බවට පත්ව සිටින්නේ ඇමෙරිකාවය. මන්ද යත් ඒ දෙකේදීම ඇමෙරිකාවේ සහාය හිමිවේ නම් ඉක්මන් සහ ලංකාවට වාසිසහගත තත්ත්වයක් නිර්මාණය කරගැනීමේ හැකියාව පැවැතීමය. නමුත් චීන නැවේ පැමිණීමත් සමග ඇමෙරිකාව ඉන්දියාවට වඩා ප්‍රබල රාජ්‍යතාන්ත්‍රික ප්‍රතිචාරයක් දැක්වීමට තීරණය කොට ඇති බව 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය. ඒ අනුව ජනාධිපතිවරයා වශයෙන් රනිල් වික්‍රමසිංහ මහතා පත්වීමෙන් පසු නිල වශයෙන් රාජ්‍ය මට්ටමින් සිදුකිරීමට නියමිත සුබපැතීම සිදුනොකිරීමට ඇමෙරිකාව තීන්දු කොට ඇති බව දැනගන්නට තිබේ. ආරංචි මාර්ග පෙන්වා දෙන්නේ ඒ හරහා ජනාධිපතිවරයාගේ පත්වීමට නිල පිළිගැනීම ලබා නොදීමට ඇමෙරිකාව තීන්දු කොට ඇති බවත්, එම තත්ත්වය දිගටම පවත්වාගෙන යෑමට ඉඩ ඇති බවත්ය.

අනෙක් පැත්තෙන් ගතහොත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධයෙන් ඇමෙරිකාවට ඇති බලපෑම සුළුපටු නැත. දැනට ලංකාවේ ආර්ථික අර්බුදයට විසඳුම් වශයෙන් අංක එකේ යෝජනාව බවට පත්වී ඇත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබාගැනීමය. එහිදී ඇමෙරිකාවේ සහාය ලංකාවට හිමිවීම අත්‍යාවශ්‍ය කාරණයක් වී තිබේ. නමුත් මතුව ඇති තත්ත්වය යටතේ මූල්‍ය අරමුදලේ සහාය ලබාගැනීමේදී ඇමෙරිකානු සහාය ලංකාවට හිමිවේදැයි යන්න සම්බන්ධයෙන් මතුව ඇත්තේ අවිනිශ්චිත තත්ත්වයකි.

## සමන්තා පවර් එවයි...



මීට අමතරව මේ වන විට ඇමෙරිකාව ඉතා බලගතු නියෝජිතයෙක් නුදුරේදීම ලංකාවට එවීමටද තීන්දු කර තිබේ. ඒ, වෙන කවුරුවත් නොව දැනට USAID ආයතනයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන සමන්තා පවර් මහත්මියය. සාමාන්‍යයෙන් සමන්තා පවර් සැලකෙන්නේ ලංකාවට පිළිබඳ හොඳ හැටි දන්නා ලංකාවේ කලක් ජීවත් වූ කාන්තාවක ලෙසය. එමෙන්ම සමන්තා බොහෝ විට සිය හිතවත්කම් ගොඩනගාගෙන ඇත්තේ ආණ්ඩුවේ නියෝජිතයන්ටත් වඩා විපක්ෂයේ නියෝජිතයන් සමගය. කොටින්ම කියනවා නම් රනිල් වික්‍රමසිංහ මහතා අගමැතිවරයා වශයෙන් පත්වූ වහාම සමන්තා පවර්ට කතාකොට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබාගැනීමට ඇගෙන් උපකාර ඉල්ලා සිටීමටද පියවර ගෙන තිබිණි. එහිදී සමන්තා රනිල්ට දැනුම්දී තිබුණේ මූල්‍ය අරමුදල රටවලට ණය ලබාදීමේදී එහි ක්‍රියාවලිය අනුගමනය කරන බවත්, ඊට බලපෑම් සිදුකළ නොහැකි බවත්, විශේෂයෙන්ම මානව හිමිකම් ආරක්ෂා කිරීමේ ක්‍රියාවලියට ආණ්ඩුව ගරු කළ යුතු බවත්ය. කෙසේ වෙතත් රනිල් ඒ සම්බන්ධයෙන් සමන්තාට කතා කළේම ඇය ලංකාව පිළිබඳ මනා අවබෝධයකින් යුතුව සිටින තැනැත්තියක් බව දන්නා නිසාය.

නමුත් ගැටලුව වී ඇත්තේ ඇමෙරිකාව මේ මොහොතේම සමන්තා පවර් ලංකාවට එවීමට ගත් තීරණය පිළිබඳවය. මන්ද යත් සමන්තා සැලකෙන්නේ මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය ආදී මාතෘකා පිළිබඳ වැඩි අවධානයක් යොමුකර කටයුතු කරන තැනැත්තියක් ලෙසිනි. පසුගිය කාලවකවානුවේදී සාමකාමී අරගලයට සිදුකළ පහරදීම්, අරගලකරුවන් අත්අඩංගුවට ගැනීම්, පැහැරගැනීම්, සිරගත කිරීම් ආදිය හෙළාදකිමින් ඇමෙරිකාව නිවේදන කිහිපයක්ම නිකුත් කර ඇති පසුබිමක සමන්තාගේ පැමිණීම සැලකෙන්නේ අහඹු සිදුවීමක් ලෙස නොව හිතාමතාම සැලසුම් කරන ලද එකක් ලෙසටය. එමෙන්ම ජිනීවා මානව හිමිකම් කවුන්සිල සැසිවාරය ලබන මාසයේදී ආරම්භ වීමට නියමිත අතර සමන්තා පැමිණෙන්නේ ඊටද සති කිහිපයක් තබාය. ඒ අනුව සමන්තාගේ ලංකා ගමන ජිනීවා සැසිවාරය හා සම්බන්ධ නොවනු ඇති බවක් සිතිය නොහැකිය.

## IMF සල්ලිවලට වෙනදේ...

අනෙක් අතට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග පවතින සාකච්ඡාද මේ වන විට පවතින්නේ ඉබි ගමනේය. තවමත් එහි කාර්යාල මට්ටමේ ගිවිසුම් අස්සන් කොට නොමැති අතර මහ බැංකු අධිපතිවරයා පවසන්නේ මේ සති අන්තයේදී එහි නිලධාරීන් කණ්ඩායමක් ලංකාවට පැමිණීමට සැලසුම් කර ඇති බවකි. අපට ඇති තොරතුරුවලට අනුව නම් කියවෙන්නේ මූල්‍ය අරමුදලේ සාකච්ඡා කල් ඇදෙනු ඇති බවත්, යම් මූල්‍ය වාරිකයක් නිදහස් වීමේ කාලවකවානුවක් දැන්ම තියා කිව නොහැකි බවත්ය. ඊට අමතරව පසුගිය සතියේ යුරෝපා කොමිසමේ තානාපතිවරුන් කණ්ඩායමක්ද පැමිණ රනිල් මුණගැසී ජී.එස්.පී. ප්ලස් සහනය ලබාදීම සම්බන්ධයෙන්

අනතුරු ඇඟවීමක් කළ බව පසුගිය සතියේ 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ අනාවරණ කිරීමට අපි පියවර ගත්තෙමු. ඒ, මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ සිද්ධීන් නිසා බවද අපි එහිදී සඳහන් කර සිටියෙමු.

මේ සියලු කරුණු කාරණා එක මිටකට ගත් කල එළැඹෙන ඔක්තෝබරය පමණ වන විට රට ආර්ථික වශයෙන් ඉතා අසීරු තත්ත්වයකට පත්වනු ඇති බව දේශපාලන ක්ෂේත්‍රයේ බොහෝ දෙනාගේ කතාබහට ලක්වන කරුණක් බවට පත්ව තිබේ.

# විජයදාස බෑම කියයි...

හදිසි මැතිවරණයක් පැවැත්වීම සම්බන්ධයෙන් කතාබහක් පැතිර යන්නේ මෙවැනි පසුබිමක් යටතේය. මීට පෙර අවස්ථා කිහිපයකදීම මෙම තීරය ඔස්සේ අපි ආණ්ඩුවේ මෙම මැතිවරණ තදියම පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමට කටයුතු කළෙමු. ඉකුත් සතියේ අප ඒ පිළිබඳ තවත් විශේෂ කරුණක් හෙළිදරව් කරමින් 22 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පොඩි වංගුවක් ගසමින් හදිසි මහ මැතිවරණයකට යෑමට ඉඩක් පාදාගෙන ඇති ආකාරය පිළිබඳවත්, ඒ පිළිබඳ තොරතුරු වාර්තා වීමෙන් අනතුරුව පොහොට්ටු මන්ත්‍රීවරුන් ඊට විරෝධය පළකළ ආකාරය පිළිබඳවත් අනාවරණ කළෙමු. රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති ධුරයට පත්වීමේදී පොහොට්ටු මන්ත්‍රීවරුන්ට ලබාදී තිබුණු පොරොන්දුවකින් කියැවුණේ වසර හතරහමාරක් ගතවන තුරු මහ මැතිවරණයක් නොපවත්වන බවකි. නමුත් පවතින ආර්ථික අර්බුදය හමුවේ වසර හතරහමාරක් ගතවන තුරු නොසිට විසිවැනි ව්‍යවස්ථා සංශෝධනයට අනුව වසර දෙකහමාරකින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට බලය හිමිවන පළමු අවස්ථාවේදීම එය විසුරුවා හැරීම රනිල්ගේ සැලැස්ම වී තිබේ.

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් පොහොට්ටුවේ ජ්‍යෙෂ්ඨයන්ට තොරතුරු වාර්තා වීමත් සමග අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා මුණගැසුණු එම ජ්‍යෙෂ්ඨයන් එම වගන්තිය ඉවත් කරන ලෙසත්, 20 වැනි සංශෝධනයට අනුව වසර හතරහමාරක් ගතවන තුරු පාර්ලිමේන්තුව විසුරුවාහැරිය නොහැකි බවට වන වගන්තිය ඊට ඇතුළත් කරන ලෙසත් ඉල්ලීමක් කොට තිබිණි. නමුත් එය ප්‍රතික්ෂේප කොට ඇති විජයදාස කියා ඇත්තේ එවැන්නක් සිදුකළ නොහැකි යැයි කියාය. ඒ අනුව ලබන මාර්තුව වන විට ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවාහැරීමේ බලය හිමිවීමට නියමිතය. නමුත් ගැටලුව වී ඇත්තේ ලබන මාර්තුව වන තුරුවත් පවතින ආර්ථික අර්බුදය හමුවේ පාර්ලිමේන්තුව ඇදගෙන යා හැකිද කියන කාරණය සම්බන්ධයෙන්ය. එසේ නම් මහ මැතිවරණයක් පැවැත්වීම සඳහා ඇති එකම විකල්පය වී ඇත්තේ පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරුන් සම්මත කරන යෝජනාවක් මගින් පාර්ලිමේන්තුව විසුරුවාහරින ලෙස ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කිරීමය. එවිට ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට හැකියාව ලැබෙනු ඇත.

# ජවිපෙට රනිල්ගෙන් පණිවුඩයක්..?



ඒ සියල්ල අතරවාරයේ ජවිපෙ මේ දිනවල ගිලී සිටින දැඩි දේශපාලන නිහඬතාව සම්බන්ධයෙන්ද බොහෝ දෙනා හට ප්‍රශ්නයක් මතුව තිබේ. ඉකුත් සතියේ අප විශේෂ අනාවරණයක් කරමින් ඉදිරියේදී #WeWantElection නමින් ජවිපෙ දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරයක් ආරම්භ කිරීමට නියමිත බව කියා සිටියෙමු. ජවිපෙ මේ දිනවල නිහඬව සිටින්නේත්, තව දින කිහිපයකින් #WeWantElection නමින් ප්‍රචාරක ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සූදානමින් සිටින්නේත් රනිල්ගෙන් මහ මැතිවරණය සම්බන්ධයෙන් යම් පණිවුඩයක් ලැබුණු නිසාදැයි බොහෝ දෙනාට ඇත්තේ බරපතළ සැකයකි. පසුගිය කාලයේදී ජවිපෙ දිගට හරහට ආණ්ඩුවට පහර දෙමින් මාධ්‍ය සාකච්ඡා පැවැත්වූවත්, ප්‍රකාශ නිකුත් කළත් මේ වන විට ඒ සියල්ල හකුළාගෙන ඇත්තේ මෙසේ පාර්ලිමේන්තුව විසුරුවාහරින බවට ජනාධිපතිවරයාගේ පාර්ශ්වයෙන් ලැබුණු පණිවුඩය හේතුවෙන් බව බොහෝ දෙනා සඳහන් කරන කාරණයක් වී තිබේ.

මීට අමතරව ලබන මාර්තුවට පෙර ආණ්ඩුව විසින් පළාත් පාලන මැතිවරණයද පවත්වා අවසන් කළ යුතුව තිබේ. මේ වන විට පළාත් පාලන ආයතනවල නිල කාලය වසරකින් දීර්ඝ කොට ඇති අතර, අවශ්‍ය නම් පාර්ලිමේන්තු පනත අනුව තවත් වසරකින් එය දීර්ඝ කිරීමටද ආණ්ඩුවට හැකියාව තිබේ. එසේ නොවුණහොත් පළාත් පාලන මැතිවරණය සහ මහ මැතිවරණය යන දෙකම ලබන වසර මුලදී පැවැත්වීමට ආණ්ඩුවට සිදුවනු ඇත. එහිදී ආණ්ඩුව බොහෝ විට මහ මැතිවරණය කලින් පවත්වා, දෙවනුව පළාත් පාලන මැතිවරණය පවත්වනු ඇති බව බොහෝ පාර්ශ්වවලින් කියැවෙන්නකි. ඒ අනුව ලබන වසර ආණ්ඩුවේ අනාගතය සහ රටේ අනාගතය තීන්දු කරන තීරණාත්මක මැතිවරණ වසරක් වනු ඇත.




# සජබ රැස්වීම විකෘති කළ මන්ත්‍රීන් දෙදෙනා

# සජබෙන් කට්ටිය යයිද..?



පසුගිය සතියේ දේශපාලන ක්ෂේත්‍රයේ ප්‍රධාන මාතෘකාවක් බවට පත්ව තිබුණේ සමගි ජන බලවේග යේ මන්ත්‍රීවරුන් පිරිසක් ආණ්ඩුවට එක්වන බවට වූ පුවතය. විවිධ මාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍යද විටින් විට මේ පිළිබඳ පුවත් පළකරමින් සජබෙන් මන්ත්‍රීවරු මෙපමණ ප්‍රමාණයක් අද ආණ්ඩුවට එක්වෙනවා, හෙට ආණ්ඩුවට එක්වෙනවා යැයි කියමින් ගණන් හිලව් ප්‍රකාශයට පත්කිරීම හේතුකොට ගෙන බොහෝ දෙනා සිතා සිටියේ ඇත්ත වශයෙන්ම සජබෙන් විශාල කණ්ඩායමක් ආණ්ඩුවට එක්වී ඇමැති ධුර ගනු ඇතැයි කියාය. ඇතැම් පුවත්පත් නම් පිටින්ම ආණ්ඩුවට එක්වන සජබෙ මන්ත්‍රී ලැයිස්තු ප්‍රකාශයට පත්කර තිබූ අතර, එහි ඉදිරියෙන්ම චම්පික රණවක, කබීර් හෂීම්, හර්ෂ ද සිල්වා, එරාන් වික්‍රමරත්න, රංජිත් මද්දුමබණ්ඩාර, රාජිත සේනාරත්න, තලතා අතුකෝරල යන අයගේ නම්ද සඳහන් කර තිබිණි. නමුත් පසුගිය සතියේදී චම්පික ට්විටර් පණිවුඩයක් නිකුත් කරමින් කියා සිටියේ තමන් කිසිසේත්ම ආණ්ඩුව සමග එක් නොවන බවය. එමෙන්ම අවස්ථා කිහිපයකදීම කබීර්, හර්ෂ, එරාන්ද මාධ්‍ය හමු පවත්වමින් කියා සිටියේ ඇමැතිකම් ලබාගෙන ආණ්ඩුවට එක් නොවන බවත්, පාර්ලිමේන්තු කමිටු ක්‍රමය හරහා ආණ්ඩුවේ වැඩකටයුතුවලට විපක්ෂයේ හිඳිමින් සහාය දක්වන බවත්ය. තලතා රත්නපුරේ පැවැති හමුවකදී ආණ්ඩුවේ වැඩපිළිවෙළ දැඩිව විවේචනය කරමින් තමන් පක්ෂයේ මතය සමග හිඳින බව කියා සිටියාය.





# රනිල් මාසයක් ඉල්ලයි

## සජබෙ රැස්වීමේ තීන්දුව...

කෙසේ වෙතත් සජබෙ මන්ත්‍රීවරුන් ආණ්ඩුවට එක්වන බවට වූ පුවතට පසුගිය සතියේ තවු ලැබීමට පාදක වූ තවත් එක් විශේෂ කාරණාවක්ද තිබිණි. ඒ, සජබෙ මහ ලේකම් රංජිත් මද්දුමබණ්ඩාර මහතාගේ නිවෙසේ පැවැති විශේෂ සාකච්ඡාවකි. මෙවැනි සාකච්ඡාවක් අවශ්‍ය බවට සජබ මන්ත්‍රී කණ්ඩායමේ කිහිප දෙනකු කළ ඉල්ලීමකට අනුව රංජිත් එම හමුව සූදානම් කොට තිබිණි. ඒ සම්බන්ධයෙන් රංජිත් පක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාටද දැනුම් දීමක් කර තිබිණි. කෙසේ වෙතත් මේ සාකච්ඡාවට එක්ව සිටි මන්ත්‍රීවරු කිහිප දෙනාගෙන් දෙදෙනකු ආණ්ඩුවට එක්ව ඇමැති ධුර ගත යුතු බව කියා සිටියත්, අනෙක් සියලු දෙනා දැඩිව කියා සිටියේ පක්ෂය ගන්නා තීන්දුවට අනුව කටයුතු කළ යුතු යැයි කියාය. දැනටමත් පක්ෂය ආණ්ඩුවට එක් නොවන බවට තීන්දුවක් ගෙන ඇති බැවින්, එම තීන්දුවට අනුව කටයුතු කළ යුතු බවද එහිදී ඔවුහු කියා සිටියහ.

## තොරතුරු දුන්න දෙන්නා...

මේ ආකාරයට සාකච්ඡාව අවසන් වුවත් ඊට පසු දින පුවත්පත් කිහිපයකම සහ ආණ්ඩුවට හිතවත් වෙබ් අඩවිවල එකම ආකාරයේ පුවතක් පළවී තිබූ අතර ඉන් කියැවුණේ සමගි ජන බලවේගයේ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර මහතා ඇතුළු මන්ත්‍රීවරුන් 20 දෙනකු ආණ්ඩුවට එක්වී ඇමැති ධුර ලබාගැනීමට සූදානමින් සිටිනවා යැයි කියාය. එම පුවතට රූපවාහිනී නාලිකාවල පෙරවරුවේ පත්තර කියවන වැඩසටහන්වලින්ද විශාල ප්‍රචාරයක් ලබාදීමට පියවර ගෙන තිබිණි. එවැනි කිසිදු කතාබහක් මද්දුමබණ්ඩාරගේ නිවෙසේ පැවැති සාකච්ඡාවේදී සිදු නොවුණු නිසා සජබෙ ජ්‍යෙෂ්ඨයන් වහාම මේ පිළිබඳ සොයා බැලීමට පියවර ගත්තේය. එහිදී ඔවුන්ට දැනගන්නට ලැබුණේ සාකච්ඡාවට සම්බන්ධව සිටි මන්ත්‍රීවරුන් දෙදෙනකු විසින් එම පුවත මාධ්‍යවලට සහ වෙබ් අඩවිවලට ලබාදී ඇති බවකි. ඒ අනුව සජබය වහාම තීන්දු කළේ බ්‍රහස්පතින්දා දිනයේදීම ප්‍රවෘත්ති සාකච්ඡාවක් කැඳවා විසින්ම එම පුවත නිවැරැදි කිරීමටය. එමෙන්ම ඉදිරියේදී මෙම අසත්‍ය පුවත මාධ්‍යයට ලබාදුන් මන්ත්‍රීවරුන් දෙදෙනා පිළිබඳ රටට හෙළිකිරීමටද සජබ ජ්‍යෙෂ්ඨයෝ තීරණය කළහ. මීට අමතරව සජිත්ද, එම රැස්වීමට සහභාගි වී සිටි මන්ත්‍රීවරු කිහිප දෙනකුද ප්‍රකාශ ලබා දෙමින් දැඩිව කියා සිටියේ කිසිසේත්ම වත්මන් ආණ්ඩුවට එක්ව ඇමැති කටු නොගන්නා බවත්, වරදාන වරප්‍රසාද හෝ මුදල්වලට ආත්මය පාවා නොදෙන බවත්ය.

## ගෝඨා ෂැංග්‍රිලා එකේ...



හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා තනතුරෙන් ඉවත්ව කිසිවකුට නොකියා රටින් පලා ගිය පසු ඔහු සම්බන්ධයෙන් වූ පරිච්ඡේදය අවසන් වනු ඇති බවක් බොහෝ දෙනා සිතා සිටියද තවමත් ගෝඨා සම්බන්ධයෙන් සිදුවන දේශපාලන කතාබහේ නිමාවක් සිදුව නොමැත. රටින් පලාගිය ගෝඨා පළමු දින කිහිපයක් රැඳී සිටියේ මාලදිවයිනේය. ඉන් අනතුරුව මාලදිවයිනෙන් සිංගප්පූරුවට ගමන් කළ ගෝඨා, එරට පිහිටි සුපිරි හෝටලයක් වන ෂැංග්‍රිලා හෝටලයේ නවාතැන් ගැනීමට පියවර ගත්තේය. මේ ෂැංග්‍රිලා හෝටලය යනු ලංකාවේ ගාලුමුවදොර පිහිටා ඇති ෂැංග්‍රිලා හෝටලයටම අනුබද්ධ එකකි. මෙරට ෂැංග්‍රිලා හෝටලය ඉදිකිරීම සඳහා ගාලුමුවදොර පිහිටි යුද හමුදා මූලස්ථානය සින්නක්කරවම ෂැංග්‍රිලා හෝටල් සමාගමට විකුණා දැමූයේ ගෝඨා ආරක්ෂක ලේකම්ව සිටි සමයේය. ඊට කෘතගුණ සැලකීමක් ලෙස සිංගප්පූරුවේ ෂැංග්‍රිලා හෝටලයේ නවාතැන් ගැනීමට එම හෝටල් සමූහය ගෝඨාට අවසර ලබාදුන්නාද යන්න තවමත් පැහැදිලි නැත. නමුත් වීසා දීර්ඝ නොකිරීම හේතුවෙන් ගෝඨාට අවසානයේ සිදුවූයේ සිංගප්පූරුවේ සිට තායිලන්තය බලා පිටත්ව යාමටය. ඒ අවස්ථාවේදී යම් යම් මාධ්‍යවල පළ වූයේ සිංගප්පූරුවේ රැඳී සිටි කාලය තුළ වූ වියදම් වෙනුවෙන් ඇමෙරිකාවේ සිටින ගෝඨාගේ පුත් මනෝජ් රාජපක්ෂ සියලු වියහියදම් දැරූ බවකි.

නමුත් ප්‍රශ්නය මතුවූයේ ගෝඨා සිංගප්පූරුවේ සිට තායිලන්තය බලා පෞද්ගලික ගුවන් යානයකින් ගමන් කිරීමත් සමගය. මේ සම්බන්ධයෙන් පසුගිය අඟහරුවාදා පැවැති කැබිනට් මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදීන් කැබිනට් ප්‍රකාශක බන්දුල ගුණවර්ධන මහතාගෙන් විමසා සිටි අතර, එහිදී ඔහු කියා සිටියේ ගෝඨාගේ ගුවන් ගමන් සඳහා ආණ්ඩුව විසින් වියදම් දැරූ බවකි.

## තායිලන්තේ මැන්ඩරීන් හෝටලේ...

කෙසේ වෙතත් සිංගප්පූරුවෙන් පිටත් වූ ගෝඨා පළමුව නවාතැන් ගැනීමට බලාපොරොත්තු වූයේ තායිලන්තයේ ෆූකට් දිවයිනේ රහසිගත ස්ථානයකය. නමුත් එය මාධ්‍යයට අනාවරණ වීමත් සමග තායිලන්ත රජය කළේ ගෝඨාට වෙනත් නවාතැන්පළක් තෝරාගන්නා ලෙස දැනුම් දීමය. ඒ අනුව ගෝඨා තෝරාගත්තේ තායිලන්තයේ බැංකොක්හි පිහිටි සුපිරි පන්නයේ හෝටලයක් වන මැන්ඩරීන් ඔරියන්ටල් හෝටලයේ ජනාධිපතිවරුන්ට වෙන්කර ඇති මහලය. බන්දුලගේ ප්‍රකාශයට අනුව මෙම හෝටල්වල වියදම්ද ආණ්ඩුව විසින් දරන බවක් හැඟී ගිය හෙයින් අඟහරුවාදා දිනම තායිලන්තයේ සිට ප්‍රකාශයක් ලබාදෙමින් ගෝඨා කියා සිටියේ තම විදෙස් සංචාරවල සියලු වියදම් තමන් විසින් දරන බවත්, ආණ්ඩුවෙන් ඒ සඳහා මුදල් ලබා නොගන්නා බවත්ය. නමුත් ගෝඨාගේ මේ සඳහනේ කොතැනකවත් පෞද්ගලික ගුවන් යානයක් කුලියට ගැනීමට ගිය වියදම සම්බන්ධයෙන් වචනයක් හෝ නොතිබීමද විශේෂ සිදුවීමකි.

කෙසේ වෙතත් මේ වියදම් පියවීම සම්බන්ධයෙන්ද මේ වන විට දේශපාලන ක්ෂේත්‍රයේ මත කිහිපයක්ම පැතිර යමින් තිබේ. එක් පිරිසක් කියන්නේ මේ වන විට ඩුබායිහි සිටින ඇවන්ගාඩ් සභාපති නිශ්ශංක සේනාධිපති මහතා විසින් ගෝඨාභයගේ සියලු වියදම් දරන බවකි. තවත් පිරිසක් කියන්නේ අප පෙර කී පරිදිම ඇමෙරිකාවේ සිටින ගෝඨාගේ පුත් මනෝජ් රාජපක්ෂ මෙම වියදම් දරනවා යැයි කියාය. කවුරු වියදම් දැරුවත් මෙසේ සුපිරි හෝටලයක දින ගණන් නවාතැන් ගෙන සිටීම සඳහා විශාල මුදලක් වැයවන බව අමුතුවෙන් කිවයුතු නැත.

## නග්ගන සැලසුමක් හදයි...

කෙසේ වෙතත් තායිලන්තයේ රැඳී සිටීම සඳහා එරට රජය විසින් ගෝඨාට දින 90ක වීසා පහසුකම් ලබාදීමට පියවර ගෙන තිබිණි. එමෙන්ම ආරක්ෂක හේතු මත ඔවුන් ගෝඨාභයට දැනුම්දී සිටියේ කිසිදු හේතුවක් මත හෝටලයෙන් පිටතට නොයන ලෙසටය. මේ සියල්ල අතරවාරයේ ශ්‍රී ලංකාවේ සිටින ගෝඨාගේ හිතවතුන් සහ ගෝඨා දේශපාලනයට රැගෙන ආ පුද්ගලයන් මේ වන විට ගෝඨාට යළි ලංකාවට පැමිණෙන ලෙස බලකර සිටීමේ මෙහෙයුමක් ආරම්භ කොට තිබේ. මුලින් මුලින් හිතවතුන් මාර්ගයෙන් මෙම ඉල්ලීම ගෝඨා වෙත දැනුම් දුන්නත් මේ වන විට එය විවිධ ටැග් ලයින් යටතේ ප්‍රචාරක ව්‍යාපෘතියක් බවට පත්කිරීමට ගෝඨා හිතවාදීන් පියවර ගෙන ඇත. ඒ අනුව #BringBackGota සහ #BringHomeGota යනුවෙන් පසුගිය සතිය වන විට දැවැන්ත මාධ්‍ය මෙහෙයුමක් ආරම්භ කිරීමට ඔවුන් කටයුතු කර තිබිණි. මේ වන විට ගෝඨා තීන්දු කර ඇත්තේ මෙම ඉල්ලීම් හමුවේ ඊට හිස නමමින් ලබන බදාදා (24) දිනයේ දිවයිනට පැමිණීමටය. එසේ පැමිණෙන විට ගෝඨාව පිළිගැනීමට විශාල ජනතාවක් කටුනායකට රැස්කිරීමටත්, ගෝඨාට අනුකම්පාව ඇතිවන ආකාරයේ මාධ්‍ය මෙහෙයුමක් දියත් කිරීමටත් මෙම පිරිස් දැනටමත් සැලසුම් සකස් කොට අවසානය. මීට අමතරව ස්වාමීන්වහන්සේලා ලවා ගෝඨාගේ ප්‍රතිරූපය වර්ධනය කෙරෙන ආකාරයේ ප්‍රකාශ නිකුත් කරවා ගැනීමටද මෙම පිරිස සැලසුම් කොට තිබේ.

## ගෝඨා අගමැතිකම ගනීද...



මෙම පසුබිම යටතේ මේ සියලු දෙනාම උත්සාහ කරන්නේ ගෝඨාව නැවතත් දේශපාලනයට ගෙනැවිත් පාර්ලිමේන්තුවට රැගෙන ඒමටය. ඒ සඳහා දැනටමත් ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත්ව සිටින සීතා අරඹේපොළ මහත්මිය සිය මන්ත්‍රී ධුරයෙන් ඉවත් කොට ඊට ගෝඨාභය නම්කිරීම ඔවුන්ගේ සැලසුමයි. එමෙන්ම මෙම පිරිසේ තර්කය වී ඇත්තේ තවමත් ලක්ෂ 69ක ජනවරමක් පවතින්නේ ගෝඨා සතුව යැයි කියාය. අවුරුදු පහක කාලය සඳහා ජනතාව විසින් එම ජනවරම ලබාදී ඇති බව ඔවුන්ගේ තර්කය වී තිබේ. ඒ අනුව සීතා අරඹේපොළගෙන් හිස් වන ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයෙන් ගෝඨා පාර්ලිමේන්තු පැමිණ පොහොට්ටුවේ නව ආණ්ඩුවක් බිහිකිරීමටත්, ඉන් අනතුරුව පොහොට්ටුවේ බහුතර මන්ත්‍රීවරුන්ගේ අස්සන් සහිතව ගෝඨා අගමැතිවරයා ලෙස නම්කොට ජනාධිපතිවරයා වෙත එම නම යොමු කිරීමටත් ඔවුන්ගේ සැලසුම වී තිබේ. එහිදී මේ වන විට සිදුව තිබෙනවා හා සමානවම ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් වුවහොත් යළිත් වතාවක් ගෝඨා හට ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දීමේ අවස්ථාවක් නිර්මාණය වනු ඇති බව ඔවුන්ගේ තර්කය වී තිබේ. මේ දිනවල සමාජ මාධ්‍ය පුරා මෙතෙක් රැව් පිළිරැව් දුන් 'ගෝඨා ගෝ හෝම්' වෙනුවට 'ගෝඨා කම් හෝම්' සටන් පාඨය ඉස්මතු වී ඇත්තේ මේ සැලසුමේ ප්‍රතිඵලයක් ලෙසටය.

## ඇමෙරිකාවෙන් දාපු නඩුව...

මේ ආකාරයට ගෝඨාගේ හිතෛෂීන් ගෝඨාව නැවත ලංකාවට ගෙන්වා දේශපාලනයට රැගෙන ඒමට සැලසුම් කරද්දී ගෝඨාභය මුල් කරගෙන කවුරුත් නොදන්නා බරපතළ අර්බුදයක් පසුගිය සතිය වන විට නිර්මාණය වී තිබිණි. ඒ, අමෙරිකානු රජය විසින් ගෝඨාට එරෙහිව ඇමෙරිකානු අධිකරණයක් ඉදිරියේ නඩු පැවරීමට පියවර ගෙන තිබීමය. 'රාජ්‍ය රහස්' තීරයට ආරංචි වන තොරතුරුවලින් කියැවෙන්නේ 2019 වසරේදී ගෝඨා සිය ඇමෙරිකානු පුරවැසිභාවය අතහැරීමට ප්‍රථම සිදුවූ සිදුවීම් කිහිපයක් මුල් කරගෙන මෙම නඩු පැවරීම සිදුකොට ඇති බවත්, ඇමෙරිකානු නීතිය උල්ලංඝනය වී ඇති බවට චෝදනා කරමින් එම නඩු පැවරීම සිදුකොට ඇති බවත්ය. මෙම තොරතුර මේ වන තෙක් කිසිදු මාධ්‍යයක් මගින් හෙළිදරව් නොකළ අතර, පළමු වරට එය රටට හෙළිදරව් කරන්නේ 'රාජ්‍ය රහස්' තීරය විසින්ය. ඒ අනුව ගෝඨා සිංගප්පූරුවේ සිටියදී ඇමෙරිකානු ග්‍රීන්කාඩ් වීසා පහසුකම් සඳහා අයැදුම් කළද මෙම නඩු පැවරීමත් සමග එම ග්‍රීන් කාඩ් වීසා පහසුකම ලබාගැනීමේ අවස්ථාව ඔහුට අහිමි වී යනු ඇති බව දැනගන්නට ඇත.

මෙම තොරතුර වාර්තා වීමත් සමග මෙම නඩුවේ ස්වභාවය පිළිබඳ 'රාජ්‍ය රහස්' තීරය වැඩිදුර තොරතුරු සොයාබැලීමක නිරත විය. එහිදී අපට දැනගන්නට ලැබුණේ යම් හෙයකින් ගෝඨා මෙම චෝදනාවට ඇමෙරිකානු අධිකරණය හමුවේ වරදකරු වුවහොත් සියලු බලය යොදා ඇමෙරිකානු රජය හට එම තීන්දුවට සිය පුරවැසියා යටත් කළ හැකි බවකි.

අනෙක් අතට ඇමෙරිකානු රජය ගෝඨාට එරෙහිව ඇමෙරිකානු අධිකරණයේ නඩු පැවරීම හරහා ලබන මාසයේ ආරම්භ වීමට නියමිත ජිනීවා මානව හිමිකම් සැසිවාරයටද බරපතළ අනතුරු ඇඟවීමක් සිදුකර තිබේ. අප අවස්ථා කිහිපයකදීම මෙම තීරය ඔස්සේ ප්‍රකාශ කර සිටියේ මෙවර මානව හිමිකම් සැසිවාරයේදී ලංකාවට එරෙහිව යෝජනාවක් සම්මත වීමේ අනතුරක් මතුව ඇති බවකි. එමෙන්ම මේ වන විටත් හිටපු යුද හමුදාපති ශවේන්ද්‍ර සිල්වා මහතා ඇතුළු හතළිස් ගණනකට සිය රටට ඇතුළු වීම තහනම් කිරීමට ඇමෙරිකාව පියවර ගෙන තිබේ. නමුත් හිටපු ජනාධිපතිවරයකු ඉලක්ක කරගෙන ඇමෙරිකාව මේ ආකාරයේ නඩු කටයුත්තක් ගොනුකිරීම හරහා ඉදිරියේදී ජිනීවාවලදී යුද අපරාධ චෝදනා මුල්කරගෙන නැවත වතාවක් විමර්ශනයක් සිදුකරන ලෙස බලපෑම් කිරීමේ අවදානමක්ද මතුව ඇත. ඒ අනුව ගෝඨාට ඇමෙරිකාවේ සිටින හොඳම නීතිඥවරුන්ගේ සහාය ගෙන මෙම නඩුවට පෙනී සිටීමට සිදුවනු ඇත. එමෙන්ම ඉන් නිදහස් වීම සඳහා ගෝඨාභයට දැඩි සටනක් කිරීමටද සිදුවනු ඇත. එවැනි තත්ත්වයක් යටතේ ගෝඨාට ඇමෙරිකානු අධිකරණයෙන් කැඳවීමක් ලැබුණහොත් ලංකා ආණ්ඩුව කුමන ප්‍රතිචාරයක් දක්වනු ඇද්ද යන්න බලා සිටිය යුතුය. කෙසේ වෙතත් මතුව ඇති මෙම තත්ත්වය යටතේ ගෝඨාට ඉතිරිව ඇත්තේ විකල්ප කිහිපයකි. ඉන් හොඳම විකල්පය වී ඇත්තේ නැවත ලංකාවට පැමිණ දේශපාලනය කිරීම බව බොහෝ දෙනාගේ අදහසය.

එමෙන්ම මෙම නඩු පැවරීමේ අනතුර ඇමෙරිකානු පුරවැසියෙක් වන බැසිල් රාජපක්ෂ මහතාටද නැතුවා නොවේ. මීට මාසයකට පමණ ඉහතදී ගෝඨා ලංකාවෙන් පිටවූ දිනයේම බැසිල්ද ඇමෙරිකාව බලා පිටත්ව යෑමට කටුනායකට පැමිණියත්, එහිදී එල්ල වූ විරෝධතා හමුවේ ගමන කල්දැමීමට බැසිල් පියවර ගත්තේය. නමුත් මේ වන විට බැසිල්ට එරෙහිව විදෙස් ගමන් තහනමක් පැනවී ඇති බැවින් ඔහුට ලංකාවෙන් පිටව යා හැකි තත්ත්වයක් මතුව නැත. නමුත් විදෙස් ගමන් තහනම ඉවත් වූ පසු බැසිල් ඇමෙරිකාව බලා පිටත්ව යන්නේ නම් ඔහුටද මෙම අවදානම මතුවනු ඇති බව බොහෝ දෙනාගේ අදහස වී තිබේ. මන්ද ඇමෙරිකානු පුරවැසියකු ලෙස බැසිල් ඇමෙරිකානු නීතිය ආරක්ෂා කිරීමට නීතියෙන් බැඳී ඇත. එරට නීතිය අනුව ඔවුන් වත්කම් බැරකම් ඉදිරිපත් කළ යුතුය. මානව හිමිකම් ආරක්ෂා කළ යුතුය. මේ අනුව ඇමෙරිකාවේ සිටින ශ්‍රී ලාංකිකයන් පිරිසක්ද මේ වන විට සිටින්නේ බැසිල් ඇමෙරිකාවට පැමිණෙන තෙක්ය. ඒ, ඇමෙරිකානු රජය බැසිල්ට එරෙහිව නඩු නොපවරන්නේ නම් එම ශ්‍රී ලාංකිකයන් මූලිකත්වය ගෙන ඇමෙරිකානු අධිකරණය හමුවේ බැසිල්ට එරෙහිව නඩු පැවරීමටය.

මේ සියල්ල අතරවාරයේ බැසිල් මේ වන විට තවත් දේශපාලන ගේමකට අතගසා තිබේ. ඒ, අලුත් පොහොට්ටු ආණ්ඩුවක් පිහිටුවීමේ වැඩපිළිවෙළටය. ඒ අනුව බැසිල් ඇතුළු කණ්ඩායමක් පසුගිය බ්‍රහස්පතින්දා දිනයේදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මුණගැසීමට පියවර ගෙන තිබිණි. මෙම සාකච්ඡාවේදී පළමුව බැසිල් ජනාධිපතිවරයාට දැනුම්දී සිටියේ ගෝඨාභය ලංකාවට පැමිණීමට නියමිතව සිටින බවත්, ඒ සඳහා ඔහුට අවශ්‍ය ආරක්ෂාව සැපයිය යුතු බවත්ය. එමෙන්ම සර්වපාක්ෂික ආණ්ඩුව පිහිටුවීම සම්බන්ධයෙන්ද සමගි ජන බලවේගය ආණ්ඩුවට එක්වීම සම්බන්ධයෙන්ද ප්‍රශ්න කර සිටීමට මෙහිදී බැසිල් ඇතුළු කණ්ඩායම පියවර ගෙන තිබිණි. එහිදී ආණ්ඩුවක් පිහිටුවීම සඳහා රනිල් මාසයක කාලයක් ඉල්ලා සිටීමට පියවර ගත්තේය. රනිල් කියා සිටියේ තවමත් ඇමැතිකම් සම්බන්ධයෙන් සජබ මන්ත්‍රීවරුන් සමග සාකච්ඡා සිදුවන බවත්, එය අවසන් කිරීමට තමන්ට තව සති දෙකක කාලයක් අවශ්‍ය බවත්ය. ඉන් අනතුරුව මාසයක් ඇතුළත ජාතික ආණ්ඩුවක් පිහිටුවීමට කටයුතු කළ හැකි බවත් රනිල් එහිදී සඳහන් කර සිටියේය.

ඉන් අනතුරුව සාකච්ඡා වූයේ එසේ පිහිටුවන ජාතික ආණ්ඩුවේ ඇමැති ධුර සම්බන්ධයෙනි. එහිදී බැසිල් පැහැදිලිවම කියා සිටියේ එම ආණ්ඩුවේ බහුතර බලය පොහොට්ටුවට හිමිවන බැවින් ඇමැති ධුර 17ක් පොහොට්ටුවට ලැබිය යුතු යැයි කියාය. ඊට රනිල්ගේ එකඟතාව පළවිය.